

අතුරුදහන් වූ තැනැත්තන් පිළිබඳ කාර්යාලය

காணாமல் போன ஆட்கள் பற்றிய அலுவலகம்

OFFICE ON MISSING PERSONS

වාර්ෂික වාර්තාව

ஆண்டு அறிக்கை

ANNUAL REPORT

2020

නො.408,නෙවන මහල, ගාලු පාර, කොළඹ 03, ශ්‍රී ලංකා
இல. 408, 03ம் மாடி, காலி வீதி, கொழும்பு 03, இலங்கை
No. 408, Level 03, Galle Road, Colombo 03, Sri Lanka



අතුරුදහන් වූ තැනැත්තන් පිළිබඳ කාර්යාලය

වාර්ෂික වාර්තාව

2020

කෙටි යෙදුම් මාලාව

CoA	දක්නට නොමැති බවට වූ සහතිකය
CoI	විමසුම් කොමිසම
CoD	මරණ සහතිකය
CTF	ප්‍රතිසන්ධාන යාන්ත්‍රණය පිළිබඳ උපදේශක කාර්ය බලකාය
ICPPED	බලහත්කාරී අතුරුදහන් කිරීමෙන් සියලුම පුද්ගලයන් ආරක්ෂා කිරීමේ ජාත්‍යන්තර සම්මුතිය
ICRC	ජාත්‍යන්තර රතු කුරුස කමිටුව
LLRC	උගත් පාඩම් සහ ප්‍රතිසංධාන කොමිෂන් සභාව
MoU	අවබෝධතා ගිවිසුම
MNIR	ජාතික ඒකාබද්ධතා, ප්‍රතිසංධාන, රාජ්‍ය භාෂා, සමාජ ප්‍රගමන සහ හින්දු ආගමික කටයුතු අමාත්‍යාංශය
OMP	අතුරුදහන් වූ තැනැත්තන් පිළිබඳ කාර්යාලය
PSS	මනෝසමාජ සහය උපාය මාර්ගය
SCRM	ප්‍රතිසංධාන යාන්ත්‍රණය පිළිබඳ සම්බන්ධීකරණ ලේකම් කාර්යාලය
WGIED	බලහත්කාරී අතුරුදහන් කිරීම් පිළිබඳ එක්සත් ජාතීන්ගේ ක්‍රියාකාරී කණ්ඩායම

පටුන

1. හැඳින්වීම 4
2. නෛතික සහ ප්‍රතිපත්තිමය මැදිහත්වීම 5
දක්නට නොමැති බවට වූ සහතිකය 6
අතුරු වාර්තා 7
අතුරු සහන 9
කොවිඩ් 19 සහන 10
නීති උපදෙස් සහ සහය 10
මිනිස් මෘතදේහ සම්බන්ධ විමසුම් සඳහා මහේස්ත්‍රාත් බලතල භාවිතා කිරීම 11
3. විමර්ශන: 15
හදුනානොගත් මෘත දේහ සොයා ගැනීම 15
අතුරුදහන් වූවන් සම්බන්ධ පවත්නා දත්ත එක්රැස් කිරීම 17
පැමිණිලි 18
අතුරුදහන් පුද්ගලයන්ගේ දත්ත ආකෘති පත්‍රය 20
දත්ත පදනම 21
පැමිණිලි ලැයිස්තුව සහ අතුරුදහන් වූ පුද්ගලයන් පිළිබඳ කොරතුරු 22
6. ආයතනික සංවර්ධනය 26
භෞතික පරිශ්‍රය ස්ථාපිත කිරීම 27
කාර්ය මණ්ඩලය බඳවා ගැනීම 27
ප්‍රාදේශීය කාර්යාල 28
ක්‍රියා පටිපාටි සහ රීති සංවර්ධනය කිරීම 29
ධාරිතා වර්ධනය හා දැනුම බෙදාගැනීම 30
කොරතුරු දැනගැනීමේ අයිතිය 30
7 සන්නිවේදනය සහ ප්‍රජාව වෙත යොමුවීම 31
පොදු අවස්ථා 32
මාධ්‍ය සමග සම්බන්ධතා 32
ඩිජිටල් මාධ්‍ය මත පැවැත්ම 33
8 අනුස්මරණය සහ ස්මරණය 33

I. හැඳින්වීම

1.1. 2016 අංක 14 දරන අතුරුදහන් වූවන් පිළිබඳ කාර්යාල පනත (පිහිටුවීම, පරිපාලනය කිරීම සහ කර්තව්‍ය ඉටු කිරීම) 2016 අගෝස්තු මස නීතිගත කරන ලදී. 2018 පෙබරවාරි 28 වන දින එවකට ජනාධිපති අතිගරු මෛත්‍රීපාල සිරිසේන විසින් ව්‍යවස්ථාදායක මණ්ඩලයේ නිර්දේශ මත අතුරුදහන් වූ තැනැත්තන් පිළිබඳ කාර්යාලයේ සභාපති ලෙස සාලිය පීරිස් මහතා ද ආචාර්ය නිමල්කා ප්‍රනාන්දු, එස්.කේ ලියනගේ මහතා (නීතිඥ), මේජර් ජනරාල් (විශ්‍රාමික) මොහාන්කි පීරිස්, ජයතීපා පුණ්‍යමූර්ති මෙය, මීරාක් රහීම් මහතා සහ කනපතිපිල්ලෙයි චෙන්දන් මහතා කොමසාරිස්වරුන් ලෙසද පත් කරන ලදී.[1]

1.2. අතුරුදහන් වූ තැනැත්තන් පිළිබඳ කාර්යාල පනතේ අරමුණු වන්නේ පුද්ගලයන් අතුරුදහන් වූ තත්ත්වයන් පැහැදිලි කරගැනීම; නැවත සිදු නොවීම සහතික කිරීම සඳහා අදාළ බලධාරීන්ට නිර්දේශ සැපයීම; අතුරුදහන් වූ තැනැත්තන්ගේ සහ ඔවුන්ගේ ඥාතීන්ගේ අයිතීන් හා අභිලාශයන් ආරක්ෂා කිරීම; අතුරුදහන් වූ තැනැත්තන් වෙනුවෙන් අවශ්‍ය සහන සැලසීම සඳහා නිසි මාවත් හඳුනාගැනීම; සහ ලද හැකි සියලු තොරතුරු දත්ත පදනමක් තුළ මධ්‍යගත කිරීම.[2]

1.3. අතුරුදහන් වූ තැනැත්තන් පිළිබඳ කාර්යාලයට බලතල සහ කාර්ය භාරයන් ගණනාවක් පවරා ඇති අතර, දක්නට නොමැති බවට වන සහතියක නිකුත් කිරීම CoAසඳහා රෙජිස්ට්‍රාර් ජනරාල් දෙපාර්තමේන්තුවට හැකිවන පරිදි අතුරුදහන් වූ තැනැත්තන්ගේ ඥාතීන්ට අතුරු වාර්තා නිකුත් කිරීම; අතුරුදහන් වූ තැනැත්තන්ගේ ඥාතීන්ට මනෝ සමාජයීය සහය ලබාදීම ඇතුළු සුබසාධන සේවාව සහ පරිපාලන සහය ලබාදීම හෝ ඒ සඳහා පහසුකම් සැපයීම; අතුරුදහන් වූ තැනැත්තන්ගේ ඥාතීන්ට හානිපූරණයන් ලබාදීම සඳහා අදාළ බලධාරීන්ට නිර්දේශ සැපයීම; විත්තිකයින් සහ සාක්ෂ්‍යකරුවන් අරක්ෂා කිරීම සඳහා ක්‍රම පද්ධතියක් සංවර්ධනය කිරීම සහ ක්‍රියාත්මක කිරීම; අතුරුදහන් වූ තැනැත්තන් පිළිබඳ සියලු විස්තර සහිත දත්ත පදනමක් නිර්මාණය කිරීම, කළමනාකරණය කිරීම සහ පවත්වා ගැනීම; පුද්ගලයන් අතුරුදහන් වීමට බලපෑ හේතු, සිදුවීම් සහ බලපෑම් සම්බන්ධයෙන් මහජනයා දැනුවත් කිරීම හා ඔවුන්ගේ අවශ්‍යතාවන් සපුරාගැනීමට සහ ආර්ථික, මනෝ සමාජයීය , නෛතික සහ පරිපාලන සහය වෙත පිවිසීම සහතික කිරීමට මහජනතාවගේ සහය ලබාගැනීමට පහසුකම් සැලසීම ඒ අතර වෙයි.[3]

1.4. රීති සැකසීමට, ස්ත්‍රී පුරුෂභාවය පිළිබඳව සංවේදී මාර්ගෝපදේශ සංවර්ධනය කිරීමට, කාර්ය මණ්ඩලය පත් කිරීමට සහ ඉවත් කිරීමට සහ එහි ඵලදායී ක්‍රියාකාරිත්වය සඳහා අවශ්‍ය ඒකක පිහිටුවීමට අතුරුදහන් වූ තැනැත්තන් පිළිබඳ කාර්යාලයට බලතල ඇත.[4] එමෙන්ම, ඉදිරියේදී අතුරුදහන් වීම් වැලැක්වීම; ස්මරණයන් සඳහා ක්‍රම සකසා දීම සහ අතුරුදහන් වීම් පිළිගැනීම; හඳුනාගත් සහ හඳුනා නොගත් මළ සිරුරු සම්බන්ධව කටයුතු කිරීම; මහජනයා දැනුවත් කිරීම සඳහා අතුරුදහන් වූ තැනැත්තන් පිළිබඳ ගැටළු සම්බන්ධව තොරතුරු පල කිරීම; අතුරුදහන් වූ තැනැත්තන්ට අදාළ ජාතික නීති සහ රෙගුලාසි සංවර්ධනය කිරීම; අතුරුදහන් වූ පුද්ගලයන් සහ ඔවුන්ගේ ඥාතීන්ගේ සමාජ සහ ආර්ථික තත්ත්වයන් වැඩි දියුණු කිරීම පිණිස හානිපූරණයන්, මනෝ සමාජයීය සහය සහ වෙනත් විධික්‍රමයන් සපයා දීම ඇතුළු ගැටළු ගණනාවක් සම්බන්ධව අනෙක් රාජ්‍ය බලාධිකාරීන්ට නිර්දේශ සැපයීමේ බලයද අතුරුදහන් වූ තැනැත්තන් පිළිබඳ කාර්යාලයට ඇත.[5]

---

[1] 2016 අංක 14 දරන අතුරුදහන් වූ තැනැත්තන් පිළිබඳ කාර්යාල පනත (පිහිටුවීම, පරිපාලනය කිරීම සහ කර්තව්‍ය ඉටු කිරීම) වගන්ති 4,5,6

[2] අතුරුදහන් වූ තැනැත්තන් පිළිබඳ කාර්යාල පනත, 10 වගන්තිය.

[3] අතුරුදහන් වූ තැනැත්තන් පිළිබඳ කාර්යාල පනත, 13 වගන්තිය.

[4] අතුරුදහන් වූ තැනැත්තන් පිළිබඳ කාර්යාල පනත, 11 වගන්තිය.

[5] අතුරුදහන් වූ තැනැත්තන් පිළිබඳ කාර්යාල පනත, 13 (1) (ඔ).

1.5. එහි විමර්ශනයන් සිදු කිරීම පිණිස පැමිණිලි භාරගැනීමට, විමසුම් ආරම්භ කිරීමට සහ අතුරුදහන් වූ තැනැත්තන් සිටින ස්ථානය විමර්ශනය කිරීමට; අතුරුදහන් වූ තැනැත්තන් පිළිබඳ කාර්යාලයේ පෙනී සිටින මෙන් කැඳවීම හෝ ලේඛනයක් හෝ වෙනත් යමක් ඉදිරිපත් කිරීම ඇතුළු අවශ්‍ය සියලු ක්‍රියාමාර්ග ගැනීමට; රහස්‍ය තොරතුරු පිළිගැනීමට හෝ කැමරාව මත තොරතුරු සටහන් කරගැනීමට; රහස්‍යකාව ආරක්ෂා කිරීමේ කොන්දේසි මත තොරතුරු පිළිගැනීමට; කැණීමක් සිදු කිරීමට හෝ මෘත ශරීර ගොඩගැනීමට අවශ්‍ය වන නියෝගයක් සඳහා මහේස්ත්‍රාත් අධිකරණයෙන් ඉල්ලීමක් කිරීමට; ඕනෑම රඳවාගැනීම් ස්ථානයක් වරෙන්තුවක් රහිතව සෙවීමට; සහ සිදු කරන ලද වරදක් සම්බන්ධයෙන් අදාළ නීති ක්‍රියාත්මක කිරීමේ හෝ අභිචෝදක අධිකාරියකට වාර්තා කිරීමට අතුරුදහන් වූ තැනැත්තන් පිළිබඳ කාර්යාලයට නිශ්චිත බලතල ඇත.[6]

1.6. අතුරුදහන් වූ තැනැත්තන් පිළිබඳ කාර්යාලයේ පෙනී සිටීමට හෝ අතුරුදහන් වූ තැනැත්තන් පිළිබඳ කාර්යාලය විසින් නිකුත් කරන සිතාසියක් මත ලේඛනයක් හෝ වෙනයම් දෙයක් ඉදිරිපත් කිරීමට අපොහොසත් වීම; අතුරුදහන් වූ තැනැත්තන් පිළිබඳ කාර්යාලය විසින් එම පුද්ගලයා වෙත යවන ලද දැන්වීමක් හෝ ලිඛිත නියෝගයකට අනුකූල වීම හෝ ප්‍රශ්නවලට පිළිතුරු දීමට ප්‍රතික්ෂේප කිරීම; තම බලය භාවිතා කිරීමේදී අතුරුදහන් වූ තැනැත්තන් පිළිබඳ කාර්යාලයේ නිලධාරියෙකුට බාධා කිරීම; හෝ දැනුවත්ව අතුරුදහන් වූ තැනැත්තන් පිළිබඳ කාර්යාලයේ වැඩ කටයුතුවලට බාධා කිරීම ඇතුළුව අතුරුදහන් වූ තැනැත්තන් පිළිබඳ කාර්යාලයේ බලයට විරුද්ධව කටයුතු කිරීමෙන් ඕනෑම පුද්ගලයෙකු එහි බලයට අගෞරව කිරීම සම්බන්ධයෙන් වැරදිකරුවෙකු කළ හැකිය.[7]

1.7. පවතින නීති සහ ප්‍රතිපත්ති ක්‍රියාත්මක කිරීම සඳහා පහසුකම් සපයන අතර නීතියේ ආධිපත්‍යය, අතුරුදහන් වූවන් සහ ඔවුන්ගේ පවුල්වල අයිතීන් සහ අභිලාශයන්ගේ මධ්‍යගතභාවය පිළිගන්නා පරිදි අතුරුදහන් වූ තැනැත්තන් පිළිබඳ කාර්යාලය එහි අරමුණු ක්‍රියාවේ යොදවා ඇත. එමෙන්ම, 2018 සහ 2019 වසරවල අතුරුදහන් වූ තැනැත්තන් පිළිබඳ කාර්යාලයේ මෙහෙයුම් කටයුතු සම්බන්ධව අතුරුදහන් වූවන්ගේ පවුල්වල අදහස් ලබාගැනීම පිණිස එම කාර්යාලය විසින් පැවැත්වූ හමුවීම් ඇතුළු අතුරුදහන් වූ තැනැත්තන් පිළිබඳ කාර්යාලය සමග සෘජුවම බෙදාගත් අදහස් සහ ප්‍රතිසංධාන යාන්ත්‍රණ සඳහා වන උපදේශන කාර්ය සාධක බලකායේ (CTF) නිර්දේශ මගින්ද කාර්යාලය මග පෙන්වීමක් ලබා ඇත.[8]

2. නෛතික සහ ප්‍රතිපත්තිමය මැදිහත්වීම

2.1. අතුරුදහන් වූ තැනැත්තන් පිළිබඳ කාර්යාලය අතුරුදහන් වූ තැනැත්තන්ගේ සහ ඔවුන්ගේ ඥාතීන්ගේ අයිතිවාසිකම් ආරක්ෂා කිරීමට මෙන්ම අතුරුදහන් වූ තැනැත්තන්ගේ පවුල්වලට ආර්ථික, මනෝ සමාජයීය, නෛතික සහ පරිපාලන සහය වෙත පිවිසීමට පහසුකම් සැපයීමේ වගකීම දරයි.[9] අතුරුදහන් වීම් නැවත සිදුවීම වැලැක්වීම, මිනිස් මෘතදේහ සම්බන්ධව කටයුතු කිරීම සහ අතුරුදහන් වූ පුද්ගලයන් සහ ඔවුන්ගේ පවුල්වල සමාජ සහ ආර්ථික තත්වයන් වැඩි දියුණු කිරීම යනාදිය ඇතුළු කරුණු ගණනාවක් සම්බන්ධව අනෙකුත් රාජ්‍ය ආයතනවලට නිර්දේශ ඉදිරිපත් කිරීමට අතුරුදහන් වූ තැනැත්තන් පිළිබඳ කාර්යාලයට බලය ඇත.[10]

2.2. ඉහත කාර්යයන් සිදු කිරීමේදී අතුරුදහන් වූ තැනැත්තන් පිළිබඳ කාර්යාලය, දක්නට නොමැති බවට වූ සහතිකය (CoA); අතුරුදහන් වූවන්ගේ පවුල්වලට දක්නට නොමැති බව පිළිබඳ සහතික ලබාගත

[6] අතුරුදහන් වූ තැනැත්තන් පිළිබඳ කාර්යාල පනත, 12 වගන්තිය
[7] අතුරුදහන් වූ තැනැත්තන් පිළිබඳ කාර්යාල පනත, 24 වගන්තිය
[8] ප්‍රතිසංධාන යාන්ත්‍රණ උපදේශන කාර්ය සාධක බලකායේ අතුරු වාර්තාව (අගෝස්තු, 2016); ප්‍රතිසංධාන යාන්ත්‍රණ උපදේශන කාර්ය සාධක බලකායේ අවසන් වාර්තාව, කාණ්ඩ I සහ II (2016 නොවැම්බර් 17)
[9] අතුරුදහන් වූ තැනැත්තන් පිළිබඳ කාර්යාල පනත, 2 (ආ): 10 (ඇ), 13 (ඉ), (ඊ) වගන්තිය.
[10] අතුරුදහන් වූ තැනැත්තන් පිළිබඳ කාර්යාල පනත, 13 (ඔ), (i),(iii),(vii). වගන්ති.

හැකි වන පරිදි අතුරු වාර්තා නිකුත් කිරීම; 2019 අයවැය මඟින් නිවේදනය කළ අතුරු සහන ක්‍රියාත්මක කිරීම; මිනිස් මෘතදේහ පිළිබඳ විමසීමවලදී මහේස්ත්‍රාත් බලකල ක්‍රියාත්මක කිරීම; අතුරුදහන් වූ තැනැත්තන්ගේ පවුල්වල කොවිඩ් සහන කටයුතු සහ පුද්ගල සිදුවීම්වලදී නෛතික සහ පරිපාලන සහය සඳහා වන ඉල්ලීම්වලට ප්‍රතිචාර දැක්වීම යනාදිය සම්බන්ධ නෛතික සහ ප්‍රතිපත්තිමය නිර්දේශ සකසන ලදී.

දක්නට නොමැති බවට වූ සහතිකය

2.3. 2016 අංක 16 දරන මරණ ලියාපදිංචි කිරීමේ (තාවකාලික විධි විධාන) (සංශෝධන) (මරණ ලියාපදිංචි කිරීමේ පනත) මඟින් අතුරුදහන් වූ තැනැත්තන්ගේ පවුල්වලට දක්නට නොමැති බවට වන සහතික නිකුත් කිරීමට බලය පවරා ඇත. දක්නට නොමැති බවට වූ සහතිකය, අතුරුදහන් වූවන්ට නීත්‍යානුකූල තත්වයක් ලබාදෙන නීත්‍යානුකූල ලේඛනයක් වන අතර මරණ සහතිකයක් නොමැති අවස්ථාවකදී අතුරුදහන් වූවන්ගේ පවුල්වල අයට පරිපාලන සහ මූල්‍ය සේවාවන් හා වෙනත් ප්‍රතිලාභ ලබාගැනීම සඳහා පිවිසිය හැකි වේ. උතුරු සහ නැගෙනහිර ඇතිවූ ගැටුම, දේශපාලන කැලඹිලි, සිවිල් කලකෝලහාල, බලහත්කාරී අතුරුදහන් කිරීම් හේතුවෙන් අතුරුදහන් වූ හෝ යුධ හමුදාවේ හෝ පොලිසියේ සාමාජිකයෙකුව සිට ක්‍රියාන්විතයේදී අතුරුදහන් වූ අය වෙනුවෙන් දක්නට නොමැති බවට වූ සහතිකය නිකුත් කළ හැකිය.

2.4. අතුරුදහන් වූ සහ අතුරුදහන් වූ බොහෝ පවුල්වල සාමාජිකයින් දක්නට නොමැති බවට වූ සහතිකය ලබා ගැනීමේ දුෂ්කරතාවන්ට මුහුණ දී සිටිති. බොහෝ දුරට එය සිදුවන්නේ නිලධාරීන් අතර දැනුවත්භාවය නොමැතිකම සහ දක්නට නොමැති බවට වූ සහතිකය ස්වයංක්‍රීයව මරණ සහතිකය බවට පරිවර්තනය කළ හැකිය යන වැරදි මතය නිසා ය.

2.5. මරණ ලියාපදිංචි කිරීමේ පනත[11] මඟින් (i) ප්‍රාදේශීය රෙජිස්ට්‍රාවරුන් විසින් පවත්වන විමසුම් ක්‍රියාවලියක් හරහා වන සාමාන්‍ය ක්‍රියාපටිපාටියක් හෝ (ii) අතුරුදහන් වූ තැනැත්තන් පිළිබඳ කාර්යාලය විසින් නිකුත් කරන ලද අතුරු වාර්තාවක් මත පදනම්ව හෝ පෙර විමසුම් කොමිෂන් සභාවක (CoI) වාර්තාවක් මත පදනම්ව විශේෂ ක්‍රියා පටිපාටියකින් දක්නට නොමැති බවට වූ සහතිකය ලබාගැනීමට විධි විධාන සලසයි.[12] රාජ්‍ය නිලධාරීන්ගේ දැනුමේ මඳ බව සහ මෙම ක්‍රියාපටිපාටීන් දෙකෙහි වියවුල් සහගත බව, දක්නට නොමැති බවට වූ සහතිකය ලබාගැනීමට උත්සාහ කිරීමේදී ගැටළු ඇති කරයි.

2.6. ආයතනික මට්ටමින්, අතුරුදහන් වූ තැනැත්තන් පිළිබඳ කාර්යාලය විසින් රෙජිස්ට්‍රාර් ජනරාල් දෙපාර්තමේන්තුව සමඟ අඛණ්ඩව සම්බන්ධ වී පවුල් සඳහා දක්නට නොමැති බව පිළිබඳ සහතික නිකුත් කිරීම පහසු කිරීම සහ කඩිනම් කිරීම අඛණ්ඩව සිදු කරන ලදී. 2019 මැයි මස දී අතුරුදහන් වූ තැනැත්තන් පිළිබඳ කාර්යාලය සහ රෙජිස්ට්‍රාර් ජනරාල් දෙපාර්තමේන්තුව සමඟ එක්ව සහයෝගිතා ලිපියක් අත්සන් කිරීමෙන් පසු නීති විධි විධාන පැහැදිලි කරගැනීමට රෙජිස්ට්‍රාර් ජනරාල් දෙපාර්තමේන්තුව සඳහා සාමාන්‍ය සහ විශේෂ ක්‍රියාපටිපාටී දෙක යටතේ දක්නට නොමැති බව පිළිබඳ සහතික නිකුත් කිරීමේ ක්‍රියාවලියේදී දිස්ත්‍රික් සහ සහකාර රෙජිස්ට්‍රාර්වරුන් විසින් අනුගමනය කළ යුතු පටිපාටීන් සම්බන්ධව විස්තර සහිතව කෙටුම්පත් කළ චක්‍රලේඛ උධෘත කරමින් අතුරුදහන් වූ තැනැත්තන් පිළිබඳ කාර්යාලය දෙපාර්තමේන්තුවේ නිලධාරීන් සහ දිස්ත්‍රික් රෙජිස්ට්‍රාර්වරුන් සමඟ සම්බන්ධ වී කටයුතු කළේ ය.[13]

---

[11] 2016 අංක 16 මරණ ලියාපදිංචි කිරීමේ (තාවකාලික විධිවිධාන) (සංශෝධිත) පනත 8 අ - 8ඉ දක්වා වගන්ති

[12] 2016 අංක 16 මරණ ලියාපදිංචි කිරීමේ (තාවකාලික විධිවිධාන) (සංශෝධිත) පනත 8 උ වගන්තිය

[13] 2016 අංක 16 මරණ ලියාපදිංචි කිරීමේ (තාවකාලික විධිවිධාන) (සංශෝධිත) පනත 8 අ - 8ඉ දක්වා වගන්ති

2.7. අතුරුදහන් වූවන්ගේ පවුල්වලට දක්නට නොමැති බව සහතිකය ලබා ගැනීමට හැකිවන පරිදි අතුරු වාර්තා නිකුත් කිරීමට අතුරුදහන් වූ තැනැත්තන් පිළිබඳ කාර්යාලයට නියම කර ඇති හෙයින්, එම සහතිකය අදාළ පවුල්වලට නිකුත් කිරීම කඩිනම් කිරීම සඳහා කාර්යාලය වරින් වර නිකුත් කළ අතුරු වාර්තා[14] පිළිබඳව රෙජිස්ට්‍රාර් ජනරාල් කාර්යාලයට දැනුම් දෙන ලදී.

2.8. පවුල් වෙතින් ලැබුණු පැමිණිලි ගණනාවකින් පසු 2020 සැප්තැම්බර් මසදී අතුරුදහන් වූ තැනැත්තන් පිළිබඳ කාර්යාලය රෙජිස්ට්‍රාර් ජනරාල් කාර්යාලය සහ සියලුම කලාප රෙජිස්ට්‍රාර්වරුන්ට, අතුරුදහන් වූ තැනැත්තන් පිළිබඳ කාර්යාලය විසින් නිකුත් කළ අතුරු වාර්තාවල වලංගුතාව සම්බන්ධයෙන් පසු විපරම් දැනුම්දීමක් නිකුත් කළේ ය.

2.9. අතුරුදහන් වූ තැනැත්තන් පිළිබඳ කාර්යාලය, දක්නට නොමැති බව පිළිබඳ සහතික හෝ මරණ සහතික ලබාගැනීමේදී අතුරුදහන්වූවන්ගේ පවුල්වලින් ලැබුණු විමසුම් සහ ඉල්ලීම් සම්බන්ධව දිස්ත්‍රික් රෙජිස්ට්‍රාර්වරුන්, ප්‍රාදේශීය ලේකම්වරුන් සහ ග්‍රාම නිලධාරීන් සමග මැදිහත් වී කටයුතු කරන ලදී.

අතුරු වාර්තා

2.10. පරීක්ෂණයක් පැවැත්වීමට නියමිතව, පැමිණිල්ලක් සම්බන්ධ පුද්ගලයා අතුරුදහන් වූ පුද්ගලයෙකු බව නිගමනය කිරීමට අතුරුදහන් වූ තැනැත්තන් පිළිබඳ කාර්යාලය සතුව ප්‍රමාණවත් තොරතුරු තිබේ නම්, අතුරුදහන් වූවන්ගේ ඥාතීන්ට අතුරු වාර්තා නිකුත් කිරීම අතුරුදහන් වූ තැනැත්තන් පිළිබඳ කාර්යාලයට පැවරේ.[15] අතුරු වාර්තාවක එකම අරමුණ වන්නේ රෙජිස්ට්‍රාර් ජෙනරාල් විසින් එවැනි අතුරුදහන් වූ පුද්ගලයෙකුගේ ඥාතියෙකුට දක්නට නොමැති බවට වූ සහතිකයක් නිකුත් කිරීමට පහසුකම් සැලසීමයි.[16]

2.11. අතුරුදහන් වූ තැනැත්තන් පිළිබඳ කාර්යාල පනත [17]සහ මරණ ලියාපදිංචි කිරීමේ පනත[18] මගින් නියම කර ඇති අතුරු වාර්තා නිකුත් කිරීමේ ක්‍රියාවලිය 2019 දී අතුරුදහන් වූ තැනැත්තන් පිළිබඳ කාර්යාලය විසින් ප්‍රතිපත්ති, ක්‍රියා පටිපාටි, රීති සහ මාර්ගෝපදේශ ඇතුළුව සම්පාදනය කරන ලදී. 2020 ජනවාරි මාසයේදී අතුරුදහන් වූ තැනැත්තන් පිළිබඳ කාර්යාලය නියමු විමසුම් ක්‍රියාවලියක් ආරම්භ කළ අතර 2020 ජනවාරි 28 වන දින අතුරුදහන් වූ තැනැත්තන් පිළිබඳ කාර්යාලය විසින් අතුරුදහන් වූ තැනැත්තෙකුගේ ඥාතියෙකුට පළමු අතුරු වාර්තාව නිකුත් කරන ලදී.

2.12. අතුරු වාර්තා නිකුත් කිරීමේ ක්‍රියාවලිය ක්‍රියාත්මක කිරීම සඳහා සහ දිස්ත්‍රික්ක මට්ටමින් විමසුම් සිදු කිරීම සඳහා අතුරුදහන් වූ තැනැත්තන් පිළිබඳ කාර්යාලය වෙත අමාත්‍ය මණ්ඩල අනුමැතිය ලැබුණද, කාර්ය මණ්ඩලය බඳවා ගැනීම තවමත් සම්පූර්ණ කර නැත. පුහුණුවලත් විමසුම් නිලධාරීන්ගෙන් සැදුම්ලත් කාර්ය මණ්ඩල සහිතව ජංගම විමසුම් ඒකක ඇති කරමින් දිවයින පුරා ක්‍රියාත්මක කරන්නට යෙදුණු දිස්ත්‍රික් මට්ටමේ විමසුම් ක්‍රියාවලිය අත්හැර දැමීමට අතුරුදහන් වූ තැනැත්තන්ගේ කාර්යාලයට බල කෙරිණි.

2.13. පවුල් වෙතින් ලැබුණු අතුරු වාර්තා සඳහා වන ඉල්ලීම් සැපිරීමට අතුරුදහන් වූ තැනැත්තන් පිළිබඳ කාර්යාලය, විමසුම් සිදු කිරීමට සහ අතුරු වාර්තා නිකුත් කිරීම පිණිස එහි කලාප කාර්යාල වෙත සංචාරය කරන පුද්ගලයන් 4 දෙනෙක් පවතින කාර්ය මණ්ඩලයෙන් නම් කරමින් කඩිනම් ක්‍රියාවලියක්

[14] 2016 අංක 14 දරන අතුරුදහන් වූ තැනැත්තන් පිළිබඳ කාර්යාල පනත 13 (1)(අ)(i)

[15] 2016 අංක 14 දරන අතුරුදහන් වූ තැනැත්තන් පිළිබඳ කාර්යාල පනත 13 (1)(අ)(i)
[16] 2016 අංක 16 මරණ ලියාපදිංචි කිරීමේ (තාවකාලික විධිවිධාන) (සංශෝධිත) පනත
[17] 2016 අංක 14 දරන අතුරුදහන් වූ තැනැත්තන් පිළිබඳ කාර්යාල පනත 13 (1)(අ)(i)
[18] 2016 අංක 16 මරණ ලියාපදිංචි කිරීමේ (තාවකාලික විධිවිධාන) (සංශෝධිත) පනත

ආරම්භ කරන ලදී. මෙය කොවිඩ්-19 වසංගත තත්ත්වය හා පළමු වරට රට වසා දැමීම සහ සංචරණ සීමාවන් විසින් තවදුරටත් ප්‍රමාද කෙරිණි.

2.14. මෙම සියලු බාධාවන් මධ්‍යයේ අතුරුදහන් වූ තැනැත්තන් පිළිබඳ කාර්යාලය වෙත අතුරු වාර්තා සම්බන්ධ ඉල්ලීම් ලැබුණු අතර ඒවා සැකසීම ද සිදු කෙරිණි. අතුරුදහන් වූ තැනැත්තන් පිළිබඳ කාර්යාල පනත[19] සහ අතුරු වාර්තා නිකුත් කිරීම සම්බන්ධ ප්‍රතිපත්ති යටතේ අදාළ වන මූලික නෛතික අවශ්‍යතා සහ ලේඛන අවශ්‍යතා සැපිරීම ඇගයීම සඳහා අතුරුදහන් වූ තැනැත්තන් සම්බන්ධ මූලික ඇගයීම් සම්පූර්ණ කරන ලදී. මෙහිදී අවම නෛතික අවශ්‍යතා සපුරන ලද්දන් සඳහා අතුරුදහන් වූ තැනැත්තන් පිළිබඳ කාර්යාලය විධිමත් විමසුම් පවත්වන ලද අතර 2020 වසර තුළදී අතුරුදහන් වූ හා සොයාගත නොහැකි වූවන්ගේ පවුල්වලට අතුරු වාර්තා 68 ක් නිකුත් කරන ලදී.

2.15. 2020 වසරේ සිදු කළ ඉහත ක්‍රියාකාරකම්වල සාරාංශයක් පහත දක්වා ඇත:

අතුරු වාර්තා සඳහා ලැබුණු ඉල්ලීම් සංඛ්‍යාව	234
ලේඛන සහ මූලික නෛතික අවශ්‍යතා සනාථ කරගැනීම සඳහා සම්පූර්ණ කරන ලද මූලික ඇගයීම් ගණන	234
විමසුම් සිදු කරන ලද සුදුසුකම් ලබන-ඉල්ලීම් ගණන	148
විමසුම් සිදු කිරීමෙන් අනතුරුව නිකුත් කිරීමට නිර්දේශිත අතුරු වාර්තා ගණන	120
නිකුත් කළ අතුරු වාර්තා ගණන	68

2.16. 2020 ඔක්තෝබර් මස පළාත් කිහිපයක් වසා දැමීම සහ ප්‍රවාහන සීමාවන් හේතුවෙන් අතුරුදහන් වූ තැනැත්තන් පිළිබඳ කාර්යාලය මාර්ගගත විමසුම් පැවැත්වීම ආරම්භ කළ අතර එහිදී, අයදුම්කරුවන් සහ අදාළ පාර්ශ්වයන් සමඟ අතුරුදහන් වූ තැනැත්තන් පිළිබඳ කාර්යාලයේ නීති ඒකකයි අතථ්‍ය ලෙස සම්මුඛ සාකච්ඡා පැවැත්වී ය. 2020 නොවැම්බර් මස සාර්ථක නියමු සැසියක් පැවැත්වීමෙන් අනතුරුව අතුරුදහන් වූ තැනැත්තන් පිළිබඳ කාර්යාලය, කොළඹ සිටින විමසුම් නිලධාරීන් සහ යාපනය, මාකර සහ මන්නාරම ප්‍රාදේශීය කාර්යාලවල සිටින අයදුම්කරුවන් සමඟ මාර්ගගත විමසුම් පැවැත්වීය.

2.17. 2019 වසරේදී අතුරු වාර්තා නිකුත් කිරීම සඳහා ප්‍රතිපත්ති සහ විමසුම් ක්‍රියාපටිපාටි ඇතුළු ක්‍රියාපටිපාටීන් සංවර්ධනය කිරීමට අමතරව අතුරුදහන් වූ තැනැත්තන් පිළිබඳ කාර්යාලය, කාර්ය මණ්ඩලය අඩුවීම සහ කොවිඩ් 19 වසංගතය විසින් ඇති ව තිබෙන සීමාවන් සලකා බලමින් 2020 වසරේදී විමසුම් ක්‍රියා පටිපාටියට යාවත්කාලීනයක් එක් කළේ ය. විශේෂයෙන්ම, මාර්ගගත විමසුම් ක්‍රියාපටිපාටිය අතරතුර අයදුම්කරුවන් සහ පවුල්වලට සහය ලබාදීමට ප්‍රාදේශීය කාර්යාලවල පවුල් සහායක නිලධාරීන් තබනු ලැබී ය.

2.18. අතුරු වාර්තා සම්බන්ධව කටයුතු කිරීමේදී ප්‍රාදේශීය කාර්යාල සඳහා අභ්‍යන්තර ක්‍රියාපටිපාටීන්, වාර්තා තබාගැනීම පිළිබඳ ක්‍රියාපටිපාටීන්, විමසුම් නිලධාරීන් සඳහා ක්‍රියාපටිපාටීන් සහ මාර්ගෝපදේශ, අතුරු වාර්තා සඳහා අතථ්‍ය සම්මුඛ පරීක්ෂණ සහ මාර්ගගත විමසුම් සඳහා මාර්ගෝපදේශ, විමසුම් සිදු කිරීමේදී විමසුම් නිලධාරීන් සහ ප්‍රාදේශීය කාර්යාල කාර්ය මණ්ඩලය සඳහා කොවිඩ් 19 මාර්ගෝපදේශ ඇතුළු වෙනත් අභ්‍යන්තර ක්‍රියාපටිපාටීන් ද 2020 වසරේදී සකසනු ලැබිණි.

2.19. වසංගත තත්ත්වය නිසා ඇති වූ අභියෝගයන් සහ මාර්ගගත විමසුම් ක්‍රියාවලිය පැවතිය ද පවුල් අබණ්ඩවම අතුරු වාර්තා ඉල්ලීම් එවූ බව අතුරුදහන් වූ තැනැත්තන් පිළිබඳ කාර්යාලය නිරීක්ෂණය කළ අතර,, එයට හේතුව වන්නේ ඔවුන්ගේ ආදරණීයයන් අතුරුදහන් වූවෙකු බව හඳුනාගෙන්නා සහ තම අයිතිවාසිකම් ලබාගැනීම සඳහා දක්නට නොමැති බව පිළිබඳ සහතිකය ලබාගත හැකි එකම නිල ලේඛනය එය වීම යි.

[19].2016 අංක 14 දරන අතුරුදහන් වූ තැනැත්තන් පිළිබඳ කාර්යාල පනත 13 (1)(අ)(i)

අතුරු සහන

2.20. 2018 අගෝස්තු මස අතුරු වාර්තාව තුළ අතුරුදහන් වූ තැනැත්තන් පිළිබඳ කාර්යාලය නිරීක්ෂණය කර ඇත්තේ වසර තිහකට අධික කාලයක් අතුරුදහන් වූ තැනැත්තන්ගේ පවුල්, රජයේ සහය රහිතව හෝ සීමා සහිතව මානසික, සමාජයීය සහ ආර්ථික බලපෑම්වලින් පීඩා විඳ ඇති බවයි.[20] බොහෝ අවස්ථාවලදී නිවසේ ප්‍රධානම උපයන්නා - සැමියා හෝ පුතා - තම බිරිඳ, වයෝවෘද්ධ දෙමාපියන් සහ කුඩා දරුවන් තනි කරමින් අතුරුදහන් වීමට ලක්ව තිබිණි. මෙම පවුල්වලට කිසිදු ආදායම් මාර්ගයක් නොමැති අතර, අතුරුදහන් වූවන්ට හිමි සුබ සාධන ප්‍රතිලාභ, වේතන හෝ සමාජ සහය ද නොලැබේ.

2.21. සමහර පවුල් විසින් මුහුණ දෙනු ලබන දැඩි දිළිඳුබව හඳුනාගනිමින් අතුරුදහන් වූ තැනැත්තන් පිළිබඳ කාර්යාලය, 2018 වසරේ තම අතුරු වාර්තාවේ 45 (අ) ඡේදය මගින් හානිපූර්ණ පැක්ෂේප නොලද අතුරුදහන් වූ තැනැත්තන්ගේ පවුල් වෙත අතුරු සහන ගණනාවක් නිර්දේශ කළේ ය. අතුරුදහන් වූ තැනැත්තන් පිළිබඳ කාර්යාලය විසින් කරන ලද එක් නිර්දේශයකට ප්‍රතිචාර වශයෙන්, දක්නට නොමැති බව පිළිබඳ සහතිකය තිබීමේ කොන්දේසිය මත ක්‍රියාන්විතයේදී අතුරුදහන් වූ බවට හඳුනාගනු ලැබෙන ත්‍රිවිධ හමුදාවේ සහ පොලිසියේ සාමාජිකයිනද ඇතුළුව අතුරුදහන් වූ තැනැත්තන්ගේ පවුල්වලට රු.6000 ක මාසික සහන මුදලක් සැපයීම පිණිස 2019 අයවැයෙන් රු.මිලියන 500 ක මුදලක් වෙන් කිරීමට රජය යෝජනා කළේ ය.

2.22. අතුරු සහන ලබාගැනීමට සුදුසුකම් නිර්ණායකය ලෙස, මරණ ලියාපදිංචි කිරීමේ පනත අනුව රෙජිස්ට්‍රාර් ජනරාල්ගේ අධිකාරිය යටතේ නිකුත් කරන ලද දක්නට නොමැති බව පිළිබඳ සහතිකය නම් කරන ලදී.[21]

2.23. 2016 දී දක්නට නොමැති බව පිළිබඳ සහතික ප්‍රදානය කිරීමේ නීති සම්පාදනය කිරීමට පෙර අතුරුදහන් වූ පුද්ගලයින් සහ දක්නට නොමැති බව පිළිබඳ සහතිකයක් නොමැති වීම මත සුදුසුකම් නොලැබූ විශාල සංඛ්‍යාවක් ඇතුළත් කිරීම සඳහා අතුරු සහන ලබා ගැනීම සඳහා සුදුසුකම් නිර්ණායක පුළුල් කිරීමේ අවශ්‍යතාව අතුරුදහන් වූ තැනැත්තන් පිළිබඳ කාර්යාලය විසින් රජයට ඉදිරිපත් කරන ලදී. මරණයට හේතුව අතුරුදහන් වීම ලෙස දක්වමින් මරණ සහතික නිකුත් කරන ලද දකුණු සහ නැගෙනහිර පළාත්වල මෙය විශේෂයෙන් දක්නට ලැබේ.

2.24. 2019 ඔක්තෝබර් මාසයේදී අමාත්‍ය මණ්ඩලය විසින් අතුරුදහන් වූ තැනැත්තන් පිළිබඳ කාර්යාලය කෙටුම්පත් කළ මුදල් අමාත්‍යවරයා සහ MNIR ඒකාබද්ධව ඉදිරිපත් කළ අමාත්‍ය මණ්ඩල සංදේශයක් අනුමත කළ අතර එහි අඩංගු වූයේ තම අතුරුදහන් වූ ආදරණීයයන් සඳහා මරණ සහතික ලබාගත් අයට අතුරු සහන ලබාගැනීමට සුදුසුකම් ලබා දීම පිළිබඳවයි. එමගින්, අතුරුදහන් වූ සහ දක්නට නොමැති වූ පුද්ගලයන්ගේ පවුල් විශාල ගණනකට අතුරු සහන ලබා ගැනීමට හැකියාව ලැබිණි.

2.25. 2019 අවසන් කාර්තුවේදී MNIR විසින් වලංගු දක්නට නොමැති බව සහතික හිමි අයට ගෙවීම් සිදු කිරීම ආරම්භ කළේ ය. අතුරුදහන් වූ තැනැත්තන් පිළිබඳ කාර්යාලය සහ රෙජිස්ට්‍රාර් ජනරාල් දෙපාර්තමේන්තුව අයදුම්කරුවන් විසින් සපයන ලද කොරතුරු සනාථ කිරීමට සහය දක්වන ලදී. MNIR විසින් 2019 නොවැම්බර් මාසය[22] වන විට පවුල් 153 කට රු.මි. 7 ක සෘජු ගෙවීම් කළ අතර ඉන්පසුව අමාත්‍යාංශය අතුරු සහන ලබා දීම නැවැත්විය.

---

[20] අතුරුදහන් වූ තැනැත්තන් පිළිබඳ කාර්යාලය (2018), 35 ඡේදය,

[21] 2016 අංක 16 මරණ ලියාපදිංචි කිරීමේ (තාවකාලික විධිවිධාන) (සංශෝධිත) පනත, 8 අ - 8 ඔ

[22] අමාත්‍යාංශය විසින් 2019 නොවැම්බර් 11 දිනැතිව අතුරුදහන් වූ තැනැත්තන් පිළිබඳ කාර්යාලයට එවන ලද ලිපිය අනුව

2.26. 2019 නොවැම්බර් මස පැවති ජනාධිපතිවරණයෙන් පසු, මෙම විෂය අධිකරණ අමාත්‍යාංශයට පවරා තිබිණි. අතුරුදහන් වූ කැනැත්තන් පිළිබඳ කාර්යාලය, එම අදාළ පවුල්වලට අතුරු සහනය අබාණ්ඩව ලබා දෙන මෙන් රාජ්‍ය අධිකාරීන් වෙතින් ඉල්ලා සිටියේ ය.

කොවිඩ් 19 සහන

2.27. අතුරුදහන් වූ සහ අතුරුදහන් වූවන්ගේ පවුල්වල ලාංකික සමාජයේ අවදානමට ලක් වූ කොටසට දැනෙන දැඩි පීඩනය සැලකිල්ලට ගෙන, අතුරුදහන් වූ කැනැත්තන් පිළිබඳ කාර්යාලය විසින් 2020 අප්‍රේල් මසදී අතිගරු ජනාධිපති ගෝඨාභය රාජපක්ෂ මහතා වෙත ලිපියක් යවමින්, කොවිඩ් සහන සැලසීමේදී පවුල්වල තත්වයන් මැන බලන ලෙස නිර්දේශ කළේය.

2.28. ජනාධිපති කාර්ය සාධක බලකාය පිහිටුවන ලද 2020 මාර්තු 6 දිනැති අංක 2168/8 දරන ගැසට් පත්‍රයේ 11 ඡේදය මඟින් "ඉහත ක්‍රියාමාර්ග ගැනීමේදී සෘජුවම අවදානමට පත් වන කාන්තාවන්, අඩු ආදායම්ලාභී පවුල් සහ පුද්ගලයින් කෙරෙහි විශේෂ අවධානයක් යොමු කිරීමට පියවර ගන්නා මෙන්", කාර්ය සාධක බලකායට නිශ්චිත නියෝගයක් ලබා දුන් බව අතුරුදහන් වූ කැනැත්තන් පිළිබඳ කාර්යාලය නිරීක්ෂණය කළේ ය.[23]

2.29. අතුරුදහන් වූවන්ගේ පවුල් අතර වඩාත් අවදානමට ලක්විය හැක්කේ වයෝවෘද්ධ අය සිටින සහ එක් පවුලේ සාමාජිකයෙකුගේ දෛනික වැටුපෙන් දිවි ගෙවන කාන්තා මූලික පවුල් බව අතුරුදහන් වූ කැනැත්තන් පිළිබඳ කාර්යාලය නිරීක්ෂණය කරයි. රටේ පවතින වාතාවරණය නිස ඔවුන්ට තවදුරටත් තම ජීවනෝපාය මාර්ගයන් කර ගැනීමට නොහැකිව ඇති අතර ඔවුන්ට සීමිත වත්කම් හෝ වත්කම් නොමැති බව මෙම පවුල් කෙරෙහි දැඩි ප්‍රතිවිපාක ඟෙන දී ඇත.

2.30. වර්තමාන අර්බුදයට ප්‍රතිචාර වශයෙන් ආහාර සහ මූල්‍ය ආධාර සැපයීම ඇතුළු ඕනෑම යෝජිත සහන පියවරයන් සඳහා අතුරුදහන් වූවන්ගේ පවුල් ඇතුළත් කළ යුතු බවට අතුරුදහන් වූ කැනැත්තන් පිළිබඳ කාර්යාලය නිර්දේශ කළේ ය.

2.31. විශේෂයෙන් කෙටි කාලීන පියවරක් ලෙස, අතුරුදහන් වූවන්ගේ පවුල් සඳහා ග්‍රාම නිලධාරීන් හරහා වියළි සලාක ලබා දෙන ලෙස අතුරුදහන් වූ කැනැත්තන් පිළිබඳ කාර්යාලය විසින් නිර්දේශ කරන ලදී. තම ප්‍රදේශයේ අතුරුදන් වූවන් පිළිබඳ ග්‍රාම නිලධාරීන් දැනටමත් කොරතුරු රැස් කර ඇති අතර, අවදානමට ලක් වූ පුද්ගලයින් සඳහා වෙනත් රාජ්‍ය ආධාර යෝජනා ක්‍රම යටතේ එවැනි පවුල් දෙවන වරටත් ප්‍රතිලාභීන් වන අවස්ථා වැළැක්වීම සඳහා එවැනි ලැයිස්තු භාවිතා කළ හැකි ය.

නීති උපදෙස් සහ සහය

2.32. සිවිල් හා හමුදා පවුල් වෙතින් අතුරුදහන් වූ කැනැත්තන් පිළිබඳ කාර්යාලය වෙත සහය සඳහා වන ඉල්ලීම් ලැබිණි; එම ඉල්ලීම් අතරට රාජ්‍ය සේවාවන් වෙත පිවිසීම, මූල්‍ය සේවාවන් වන්දි, මරණ සහතික සහ විශ්‍රාම වැටුප් ලබාගැනීම, දක්නට නොමැති බව පිළිබඳ සහතික ලබා ගැනීම, පවතින නඩු, වත්කම් පිළිබඳ මතභේද, උරුමය සහ අනුප්‍රාප්තිය වීම යනාදී ඉල්ලීම් ඇතුළත් විය. හානිපූරණ කාර්යාලය, රෙජිස්ට්‍රාර් ජනරාල් දෙපාර්තමේන්තුව, පළාත් පාලන ආයතන සහ ත්‍රිවිධ හමුදාව ඇතුළු අදාළ රාජ්‍ය ආයතන සමඟ එවැනි කරුණු සාකච්ඡා කිරීමෙන් අතුරුදහන් වූ කැනැත්තන් පිළිබඳ කාර්යාලය ප්‍රතිචාර දැක්වූවේ ය. හැකි සෑම විටම නීති උපදෙස්, ප්‍රායෝගික මග පෙන්වීම් සහ යොමු කිරීම් කරමින් අතුරුදහන් වූ කැනැත්තන් පිළිබඳ කාර්යාලය එම පවුල් සඳහා සහාය විය.

[23] ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ අතිවිශේෂ ගැසට් පත්‍රය, අංක 2168/8, (2020 මාර්තු 26)

අතුරුදහන් වූවන්ගේ පවුල් වලින් ලද විමසීම් අනුව අදාළ දිස්ත්‍රික් රෙජිස්ට්‍රාර්වරුන්, ප්‍රාදේශීය ලේකම් කාර්යාල සහ ග්‍රාම නිලධාරීන්ගේ මැදිහත් වීමෙන් දක්නට නොමැති බව පිළිබඳ සහතික හෝ මරණ සහතික ලබා ගැනීම සඳහා එක් එක් අවස්ථාවලදී අතුරුදහන් වූ තැනැත්තන් පිළිබඳ කාර්යාලය පවුල් වෙත සහාය විය.

මිනිස් මෘතදේහ සම්බන්ධ විමසුම් සඳහා මහේස්ත්‍රාත් බලතල භාවිතා කිරීම

2.33. අතුරුදහන් වූ තැනැත්තන් පිළිබඳ කාර්යාල පනතේ 12 (ඇ) වගන්තිය යටතේ අතුරුදහන් වූ තැනැත්තන් පිළිබඳ කාර්යාලයට සැකසහිත මිනීවලවල් කැණීමට සහ මෘතදේහ ගොඩගැනීමට සහ එවැනි කැණීමක් හෝ ගොඩගැනීමක් නිරීක්ෂණය කිරීමට සහ එයට අදාළ ඉදිරි කටයුතු කිරීමට මහේස්ත්‍රාත් අධිකරණයෙන් නියෝගයක් ඉල්ලීම් කිරීමේ බලය ඇත. සැකසහිත සොහොන් බිම් සම්බන්ධ විමසුම්වලදී නිරීක්ෂකයෙකු ලෙස කටයුතු කිරීමේදී බලතල භාවිතා කරන විට,[24] අතුරුදහන් වූ තැනත්තන් පිළිබඳ කාර්යාලයට පෙනී ගියේ 1979 අංක 15 දරන අපරාධ නඩු විධාන සංග්‍රහ පනත (අපරාධ නඩු විධාන සංග්‍රහය) යටතේ මිනිස් මෘතදේහ සම්බන්ධව විමසූ කිරීමට ඇති බලය සංගත ලෙස භාවිතා නොකරන බවයි. එහි ප්‍රතිඵලයක් ලෙස මිනිස් මෘතදේහ සම්බන්ධව මහේස්ත්‍රාත් විමසුම්, සාර්ථක නිගමනයන්ට එළඹීය හැකි වන ලෙස ඒකීය සහ සම්මත ආකාරයකට සිදු නොවේ. අතුරුදහන් වූ තැනැත්තන් පිළිබඳ කාර්යාලය සිය අවධානයන් ගොනු කර අධිකරණ සේවා කොමිසමේ සලකා බැලීම සඳහා නිර්දේශ ඉදිරිපත් කළේ ය.[25]

2.34. සැක කටයුතු සොහොන් බිම් ගැන පරීක්ෂණ කිරීම සුවිශේෂී අභියෝග ඇති කරන අතර සාමාන්‍ය අපරාධ හා අධිකරණ වෛද්‍ය පරීක්ෂණ වල නියුක්ත වූවන්ට වඩා වෙනස් විමර්ශන ප්‍රවේශයන් අවශ්‍ය වේ. සාමාන්‍ය අපරාධ පරීක්ෂණ වලදී, මියගිය පුද්ගලයාගේ මෘදු පටක සහ පෞද්ගලික දේ වැනි වෙනත් හඳුනාගැනීමේ සලකුණු (උදාහරණ ලෙස ඇඳුම් පැළඳුම් සහ ස්වර්ණාභරණ) බොහෝ විට නොවෙනස්ව පවතී. ශරීරයේ එවැනි මෘදු පටක සහ අනෙකුත් පුරාවිද්‍යාත්මක සාධක තිබීම මරණයට හේතුව තහවුරු කර ගැනීම සහ ශරීරය හඳුනා ගැනීම මගින් ක්‍රියාවලියේ සංකීර්ණත්වය අවම වේ.

2.35. සැක සහිත සොහොන්බිම් සම්බන්ධයෙන් ගත් විට, නටබුන් වූ විවිධ වඟ වල සහ සම්පූර්ණ හෝ අර්ධ වශයෙන් ඇටසැකිලි සහ මරණයට පෙර, මරණය අතරතුර හෝ පසු ඇති වූ කම්පන වල සලකුණු දක්නට ඇත. තවද, සාමාන්‍ය අපරාධ විමර්ශන වලදී මෙන් නොව, මිනිස් ඇටසැකිලි 150 කට වැඩි ප්‍රමාණයක් කැණීම් කර ඇති මන්නාරම නගරයේ, මන්නාරම සතොස ගොඩනැගිල්ලේ සැක සහිත සොහොන්බිම සම්බන්ධයෙන් ඇති අංක B 232/18 දරණ නඩුවේ මෙන් මිනිස් අවශේෂ පරිමාව බෙහෙවින් වැඩි විය හැකි ය.

2.36. සැක සහිත සොහොන් බිමක් සම්බන්ධ සාර්ථක විමර්ශනයක් සඳහා මරණයට හේතුව තහවුරු කර ගැනීම සහ දේහය හඳුනා ගැනීම අවශ්‍ය වේ. සැක සහිත සොහොන් බිම්වල මිනිස් මෘතදේහ හඳුනාගැනීම සම්බන්ධ අභියෝගයන් හේතුවෙන් ඒවා අනෙකුත් විමර්ශනයන්ගෙන් වෙනස් වේ. සැක සහිත සොහොන් බිමක් විමර්ශනය කිරීමේ ක්‍රියාවලියට විද්‍යාත්මක හා විද්‍යාත්මක නොවන ක්‍රම අවශ්‍ය විය හැකි ය. එය පවතින ප්‍රදේශයේ ඉතිහාසය තහවුරු කරගැනීම සහ ප්‍රාදේශීය අවසන් කටයුතු පැවැත්වීමේ සිරිත් හඳුනාගැනීම යනාදිය විද්‍යාත්මක නොවන ක්‍රමයන්ට අයත් විය හැකි ය. විද්‍යාත්මක ක්‍රම වලට අධිකරණ වෛද්‍ය විද්‍යාව, අධිකරණ පුරාවිද්‍යාව, අධිකරණ මානව විද්‍යාව සහ අධිකරණ

---

[24]. අතුරුදහන් වූ තැනැත්තන් පිළිබඳ කාර්යාලය පහත නඩුවල නිරීක්ෂකයෙකු වෙයි: මන්නාරම මහේස්ත්‍රාත් අධිකරණයේ නඩු අංක B232/18 සහ B768/13, මුලතිව් මහේස්ත්‍රාත් අධිකරණයේ නඩු අංක AR/808/19 සහ AR/503/20, කිලිනොච්චි මහේස්ත්‍රාත් අධිකරණයේ නඩු අංක B/542/20. වැඩි දුර විස්තර සඳහා ඡේදය 3.5 බලන්න.

[25]අධිකරණ සේවා කොමිෂන් සභාවේ සභාපති, ජනාධිපති නීතිඥ සාලිය පීරිස් මහතාගේ ලිපිය (2020 සැප්තැම්බර් 29).

වෛද්‍ය විද්‍යාත්මක විද්‍යාව පදනම් කරගත් සොයා ගැනීම් පිළිබඳ බහු විෂය විශ්ලේෂණයක් ඇතුළත් විය හැකිය.

2.37. යම් ස්ථානයක කැණීම් කරන ලද නටබුන් හඳුනා ගැනීම සහතික කිරීම සඳහා, සොහොන් බිමකින් උත්පාදනය කරන ලද සියලුම මිනිස් අවශේෂ සහ ඒ ආශ්‍රිත සොයා ගැනීම් පවුල් විසින් ලබා දුන් තොරතුරු සමග සමපාත විය යුතු ය. විශේෂයෙන්, අතුරුදහන් වීමේ තත්ත්වය සහ අතුරුදහන් වූ තැනැත්තා පිළිබඳ පෞද්ගලික, ශාරීරික, වෛද්‍ය සහ දන්ත තොරතුරු (පූර්ව මරණ පරීක්ෂණ දත්ත) පිළිබඳව පවුල් විසින් ලබා දුන් තොරතුරු, එම ස්ථානයෙන් කැණීම් කළ කරුණු සමග සමපාත විය යුතුය.

2.38. සොහොන් බිමේ වයස සහ මියගිය පුද්ගලයාගේ මරණයට හේතුව පිළිබඳව නිගමනයකට එළඹීම සඳහා ඉහත සඳහන් පුරාවිද්‍යාත්මක හා මානව විද්‍යාත්මක තොරතුරු එකිනෙකා විශ්ලේෂණය කිරීම, අර්ථ නිරූපණය කිරීම සහ එකිනෙක සමග එකඟත්වයකට පැමිණීම කළ යුතුය.

2.39. එම නිසා, මිනිස් මෘතදේහ පිළිබඳ විමර්ශන සන්දර්භය තුළ, සොයා ගැනීම් ඉතා පරීක්ෂාකාරීව එකතු කිරීම, හැසිරවීම, ප්‍රවාහනය, ගබඩා කිරීම සහ විශ්ලේෂණය කිරීම ඉතා වැදගත් ය. නීති ක්‍රියාවලිය තුළ ඕනෑම අවස්ථාවක සොයා ගැනීම් වැරදි ලෙස හසුරුවා ගැනීමෙන් ඒවායේ නිවැරදි අර්ථ නිරූපණය සිදු විය නොහැකි අතර මරණයට හේතුව තහවුරු කර ගැනීම සහ දේහය හඳුනා ගැනීම වැලැක්වීමට ඉඩ ඇත. තවද, යම් වරදක් සිදුවී ඇති බව විමර්ශනයෙන් හෙළිදරව් වුව හොත්, නුසුදුසු ලෙස හසුරවන ලද සොයාගැනීම්, පසුව සිදු කෙරෙන අපරාධ නඩු විභාග වලදී භාවිතා කිරීමට නොහැකි වනු ඇති අතර එමඟින් යුක්තිය ඉටුකිරීමේ ඵලදායී ලෙස සිදු කළ නොහැකිවනු ඇත.

2.40. මිනිස් මෘතදේහ පිළිබඳ පරීක්ෂණ පැවැත්වීම සඳහා අපරාධ නඩු විධාන සංග්‍රහය යටතේ මහේස්ත්‍රාත්වරුන්ට බලතල ගණනාවක් ඇත. අපරාධ නඩු විධාන සංග්‍රහයේ XXX පරිච්ඡේදය යටතේ මහේස්ත්‍රාත්වරයෙකුට මරණ පරීක්ෂණයක් පවත්වා මිනිස් මෘතදේහය පිළිබඳව සොයා බලා මරණයට හේතුව තහවුරු කිරීමේ බලය ඇත. එසේ කිරීමේදී 370 (5) වගන්තිය අනුව ඕනෑම සාක්ෂිකරුවෙකුට පැමිණීමට බල කිරීමට සහ 373 (1) වගන්තිය අනුව මෘතදේහයක් පරීක්ෂා කර වාර්තා ඉදිරිපත් කර වාර්තාවක් ඉදිරිපත් කිරීමට රජයේ වෛද්‍යවරයෙකු කැඳවීමට මහේස්ත්‍රාත්වරයාට බලය ඇත.

2.41. ඊට අමතරව අපරාධ නඩු විධාන සංග්‍රහයේ 9 වන වගන්තිය යටතේ, මිනිස් දේහය පිළිබඳව සොයා බැලීමට මහේස්ත්‍රාත්වරයෙකුට බලය ඇත. අපරාධ නඩු විධාන සංග්‍රහයේ 124 වගන්තිය යටතේ සහාය ලබා දීමට සහ පරීක්ෂණයක් ඉදිරියට ගෙන යාමට මහේස්ත්‍රාත්වරයෙකුට සුදුසු නියෝග කළ හැකි ය. තවද, 116 (3) වගන්තිය යටතේ මහේස්ත්‍රාත්වරයෙකුට රජයේ රස පරීක්ෂක දෙපාර්තමේන්තුව, සැක කටයුතු ලේඛන පරීක්ෂක, ඇණිලි සලකුණු පිළිබඳ රෙජිස්ට්‍රාර් හෝ රජයේ වෛද්‍ය නිලධාරියෙකුගෙන් විශේෂඥ අදහස් ලබා ගැනීමට නියෝගයක් නිකුත් කළ හැකි ය.

2.42. සාක්ෂි නිසි පරිදි පරිහරණය කිරීම හා ගබඩා කිරීම සහතික කිරීම සඳහා මහේස්ත්‍රාත්වරයෙකුට නිශ්චිත බලතල ඇත. අපරාධ නඩු විධාන සංග්‍රහයේ XXX පරිච්ඡේදයේ 372 (1) වගන්තියට අනුව, මහේස්ත්‍රාත්වරයා විසින් මරණ පරීක්ෂණයකදී ලබාගත් සාක්ෂි සහ සොයා ගැනීම් වාර්තා කළ යුතු ය. අපරාධ නඩු විධාන සංග්‍රහයේ 115 වගන්තියට අනුව, කිසියම් විමර්ශනයකදී කිසියම් ආයුධයක්, ලියවිල්ලක් හෝ සාම්පලයක් අත්අඩංගුවට ගෙන තිබේ නම් එය මහේස්ත්‍රාත් අධිකරණයට ඉදිරිපත් කළ යුතු ය. තවද, 1961 අංක 3 දරණ සාක්ෂි ආඥා පනතේ 60 සහ 165 වගන්ති වලට අනුව වාචික සාක්ෂි මඟින් ඕනෑම ද්‍රව්‍යමය වස්තුවක පැවැත්ම හෝ තත්ත්වය ගැන සඳහන් වන විට අධිකරණයකට එය පරීක්ෂා කිරීම සඳහා එම ද්‍රව්‍ය නිෂ්පාදනය කිරීම අවශ්‍ය විය හැකි ය.

2.43. අපරාධ පරීක්ෂණ විධි විධාන සංග්‍රහය යටතේ මහේස්ත්‍රාත්වරයාට පරීක්ෂණ පැවැත්වීම සඳහා ලබා දී ඇති විමර්ශන බලතල අඛණ්ඩව ක්‍රියාත්මක වී නැති බව අතුරුදහන් වූ කැනැත්තන් පිළිබඳ කාර්යාලය විසින් නිරීක්ෂණය කරන සෑම ක්‍රියාවලියකදීම පෙනී ගොස් ඇත.

2.44. විමර්ශනයට නොගැලපෙන ප්‍රවේශයන් හේතුවෙන් සාක්ෂිවල භාරකාර ධුරාවලිය සහතික කරගැනීමේදී, විශේෂයෙන් අදාළ බිම් වෙතින් සාක්ෂ්‍ය ලබාගැනීම, ලේඛනගත කිරීම, ගනඩා කිරීම සහ එයට ප්‍රවේශ වීමේ ක්‍රියාවලීන් තුළ අභියෝගයන් මතුව ඇත. තවද, මිනිස් මෘතදේහ පිළිබඳ පරීක්ෂණ සඳහා බහුආංශික ප්‍රවේශයක් අනුගමනය නොකරන බව අතුරුදහන් වූ කැනැත්තන් පිළිබඳ කාර්යාලය නිරීක්ෂණය කර ඇති අතර, එහි ප්‍රතිඵලයක් වශයෙන්, පරීක්ෂණයක් ඉදිරියට ගෙන යාමේදී සිදු කරන සොයා ගැනීම් සම්බන්ධයෙන් තරගකාරී කල්පිතයන් සලකා බැලීමක් නොකරන බැවින් ඒවාට අදාළව සාර්ථක නිගමනයන්ට පැමිණීම වලක්වනු ලැබේ.

2.45. භාරකාර ධුරාවලිය සහතික කිරීමේදී පහත අභියෝගයන්ට මුහුන දීමට සිදුවන බව අතුරුදහන් වූ කැනැත්තන් පිළිබඳ කාර්යාලය නිරීක්ෂණය කර ඇත.

a. අදාළ ස්ථානයෙන් ලබා ගැනීම: මිනිස් මෘතදේහ, පුරාවිද්‍යාත්මක සහ මානව විද්‍යාත්මක සොයාගැනීම් එම ස්ථානයේදීම ලේඛනගත කළ යුතුය; නිසි ක්‍රමයක් භාවිත කර කැණීම් සිදු කළ යුතු ය; පිරිසිදු කර, ඇසුරුම් කර ලේබල් කළ යුතු ය; විස්තීර්ණ ඉන්වෙන්ට්‍රියක කොටසක් ලෙස නම් කර සලකුණු කළ යුතු ය.

i. *එම ස්ථානයේදීම ලේඛනගත කිරීම:* වඩා නිවැරදි අර්ථ කථනයක් සඳහා කැණීමට පෙර, සොයාගැනීම්වල පෙනුම සහ ස්ථානය යනාදිය පෙන්වන ඡායාරූප සමග සියලුම සාක්ෂ්‍ය ලිඛිත සහ දෘශ්‍යමය ලේඛන තුළින් එම ස්ථානයේදීම ලේඛනගත කළ යුතු ය.

ii. *එකතු කිරීම ගැනීමේ ක්‍රමය:* නිසි කැණීම් ක්‍රමයක් භාවිතා කළ යුතු ය. සමහර අවස්ථාවලදී සොයාගැනීම්වලට හානි විය හැකි, එහි ස්වභාවය වෙනස් විය හැකි හෝ අහිමි විය හැකි ආකාරයේ බර යන්ත්‍ර සූත්‍ර භාවිතා කරනු දැකිය හැකි ය.

iii. *පිරිසිදු කිරීම, ඇසිරුම් කිරීම සහ ලේබල් කිරීම:* ප්‍රවාහන කටයුතු වලට පෙර, සොයා ගැනීම්වලට හානි නොවන පරිදි හෝ වෙනස් නොවන පරිදි සාක්ෂි පිරිසිදු කිරීමට හා ඇසුරුම් කිරීමට සුදුසු ක්‍රම උපයෝගී කර ගැනීම අවශ්‍ය වේ. සියලුම එවැනි සොයාගැනීම් ක්‍රමානුකූලව ලේබල් කිරීමද අවශ්‍ය වේ.

iv. *විස්තීර්ණ ඉන්වෙන්ට්‍රිය:* සෑම සොයාගැනීමක්ම විස්තරාත්මක ඉන්වෙන්ට්‍රියක කොටසක් ලෙස සැකසිය යුතු ය.

v. *භාණ්ඩ ලෙස සලකුණු කිරීම:* සොයාගත් දේ, පස්, ඇටුම් සහ ආයුධ ඇතුළු සියල්ල එය අයත් කුමන අධිකාරියටද යන්න නොසලකා භාණ්ඩ ලෙස සලකුණු කළ යුතු ය.

b. ගබඩා කිරීම: අතුරුදහන් වූ කැනැත්තන් පිළිබඳ කාර්යාලය, සොයාගැනීම් ගබඩා කිරීමේ නිවැරදි නොවන එළඹුම් නිරීක්ෂණය කර ඇත. මෙම සොයා ගැනීම් අධිකරණය අධිකරණ වෛද්‍ය නිලධාරියා සහ පොලිසිය උසාවිය ඇතුළු බලධාරීන් කිහිපයක් භාරයේ ගබඩා කර ඇත. සාක්ෂි ගබඩා කිරීම, විවිධ ක්‍රියාවලීන් සහ ප්‍රමිතීන් මෙන්ම භාරකාර ධුරාවලිය සහතික කිරීම සඳහා බලාධිකාර ගණනාවක් වග කියනු ලබයි. නඩුව අත්හිටුවන්නේ නම්, නඩුව නැවත කැඳවනු ලැබුවහොත් සාක්ෂි නැවත පැමිණීමට හැකි වන පරිදි සැකසහිත සොහොන් බිම්වලින් එකතු කරන ලද සොයාගැනීම් ගබඩා කර තැබිය යුතු ය.

c. පිටපුම: විමර්ශනයේදී ජනනය කරන ලද සියළුම කරුණු විශ්ලේෂණය කිරීම, අර්ථ නිරූපණය කිරීම සහ සංනිදියාව ඇති කිරීම සහතික කිරීම සඳහා, පරීක්ෂණ පිළිබඳ වාර්තාවක් ඉදිරිපත් කරන ලෙස අධිකරණ වෛද්‍ය නිලධාරියාට හෝ පුරාවිද්‍යාඥයෙකුට සියලු සාක්ෂි සඳහා

කාලෝචිත ප්‍රවේශයක් ලබා දීම අත්‍යාවශ්‍ය වේ. කෙසේ වෙතත්, සාක්ෂි බහුවිධ බලධාරීන් භාරයේ තබාගෙන ඇති හෙයින්, සාක්ෂි වෙත ප්‍රවේශය සහතික කිරීම, ඒවායේ විශ්ලේෂණය හා අර්ථ නිරූපණයට මෙන්ම විමර්ශනය සාර්ථකව අවසන් කිරීමට බාධා කරන බව අතුරුදහන් වූ තැනැත්තන් පිළිබඳ කාර්යාලය විසින් නිරීක්ෂණය කර ඇත.

d. *මහේස්ත්‍රාත්වරුන් සහ අධිකරණ කාර්යාල මණ්ඩල අතර භාරකාර ධුරාවලිය* මහේස්ත්‍රාත්වරුන් සහ අධිකරණ කාර්ය මණ්ඩලය විවිධ අධිකරණ බලප්‍රදේශවලට ගමන් කරන විට, අනුගාමික මහේස්ත්‍රාත්වරුන් භාරකාර ධුරාවලිය සම්බන්ධව පෙර මහේස්ත්‍රාත්වරයාගේ පරිවය පිළිගෙන අනුගමනය කරයි. පසුකාලීනව කිසිදු හේතුවක් සඳහන් නොකර පරීක්ෂණයේ මුලසුන දරන මහේස්ත්‍රාත්වරයා විමර්ශනය ආරම්භයේදී සාක්ෂි හසුරුවන ආකාරය පිළිබඳ වගකීම භාර ගැනීම ප්‍රතික්ෂේප කරන තත්ත්වයන්ට මෙය හේතු වී තිබේ.

2.46. ඉහත දක්වා ඇති පරිදි, ඇටසැකිලි බවට පත්වූ මිනිස් මෘතදේහ පිළිබඳ පර්යේෂණ සඳහා විද්‍යාත්මක නොවන ක්‍රම මෙන්ම බහු විද්‍යාත්මක ක්‍රම යෙදීම අවශ්‍ය වේ. එබැවින් අධිකරණ වෛද්‍ය නිලධාරියෙකුට අමතරව අපරාධ පුරාවිද්‍යා, අධිකරණ වෛද්‍ය විද්‍යාඥයින්, අපරාධ නිළධාරීන්ගේ පොලිසිය සහ පොලිස් දර්ශන ඇතුළු විවිධ විෂයයන් පිළිබඳ විශේෂඥයින්ගේ විශ්ලේෂණයන් සාක්ෂි වල අර්ථ නිරූපණය දැනුම් දීම වැදගත් ය.

2.47. එම නිසා, සොයාගැනීම් අර්ථකථනය කිරීමට හෝ පරීක්ෂණයේ ප්‍රතිඵලය තීරණය කිරීමට පෙර, මහේස්ත්‍රාත්වරයෙකු සාක්ෂි පිළිබඳ සියලු උපකල්පනයන් සලකා බලා එකඟ වන බවට වග බලා ගනිමින් බහු විශේෂඥයින්ගෙන් වාර්තා ලබා ගැනීම කළ යුතු ය.

2.48. විමර්ශන පැවැත්වෙන ආකාරය පිළිබඳව පාර්ශවකරුවන් කිහිප දෙනෙකුගේ අදහස් දැනුම් දීම සහතික කිරීම සඳහා, අතුරුදහන් වූ තැනැත්තන් පිළිබඳ කාර්යාලය මහේස්ත්‍රාත්වරුන් විසින් පාර්ශ්වකරුවන් අතර කැඳවනු ලබන විමර්ශන කණ්ඩායම්වලට නිර්දේශ ඉදිරිපත් කිරීම සහ සහභාගි වීම කරන ලදී.

2.49. ඉහත සඳහන් කළ හේතු නිසා, මිනිස් මෘතදේහ පිළිබඳ පරීක්ෂණ පැවැත්වීම සඳහා අදාළ බලතල ඒකාකාරීව හා ස්ථාවරව ක්‍රියාත්මක වන පරිදි භාරකාර ධුරාවලිය ආරක්ෂා කර ගැනීම සඳහා මහේස්ත්‍රාත් අධිකරණයට මාර්ගෝපදේශ නිකුත් කිරීම සලකා බලන ලෙස අතුරුදහන් වූ තැනැත්තන් පිළිබඳ කාර්යාලය නිහතමානීව ඉල්ලා සිටියේ ය.

2.50. අදාළ චක්‍රලේඛය මගින් පහත දේ සලකා බලන ලෙස අතුරුදහන් වූ තැනැත්තන් පිළිබඳ කාර්යාලය ඉල්ලා සිටී:

a. අදාළ ස්ථානයේදීම සොයාගැනීම් ලේඛනගත කිරීමේ ක්‍රිවලිය ;
b. අදාළ ස්ථානයේදීම සොයාගැනීම් එක් රැස් කරගැනීමේ ක්‍රියාවලිය;
c. ලබාගැනීමෙන් අනතුරුව එම සොයාගැනීම් පිරිසිදු කිරීම, ඇසිරුම් කිරීම සහ ලේබල් කිරීම
d. එකතු කරන ලද සියළුම සොයාගැනීම් පිළිබඳ සවිස්තරාත්මක ඉන්වෙන්ටරි සකස් කිරීමේ ක්‍රමය; සහ
e. එකතු කරන ලද සියළුම සොයාගැනීම් භාණ්ඩ ලෙස සලකුණු කිරීමේ ක්‍රමය.

2.51. අපරාධ ස්ථානය, පොලිසිය, අධිකරණ වෛද්‍ය නිලධාරීන්, පුරාවිද්‍යාඥයින් සහ රජයේ රස පරීක්ෂක දෙපාර්තමේන්තුව ඇතුළු සාක්ෂි හැසිරවීමේදී විවිධ බලධාරීන්ගේ කාර්යභාරය එවැනි චක්‍රලේඛයකින් සලකා බැලිය යුතු යැයි අතුරුදහන් වූ තැනැත්තන් පිළිබඳ කාර්යාලය නිහකමානීව ඉල්ලා සිටියේය.

2.52. සාක්ෂි ගබඩා කිරීම සඳහා වගකිව යුතු බහුවිධ බලධාරීන් අතර ඒකාකාර ප්‍රමිති සහ ක්‍රියාවලීන් සහතික කිරීම සඳහා වන පියවර ඇතුළත් කරන ලෙසත් භාරකාර ධුරාවලිය සහතික කිරීමේ ක්‍රියාවලිය මගින් සාක්ෂි විශ්ලේෂණය කර ඔවුන්ගේ වාර්තා අධිකරණයට ඉදිරිපත් කිරීමට අදාළ විශේෂඥයින්ට කාලෝචිත ලෙස ප්‍රවේශ වීමට හැකි වීම සම්බන්ධවද අතුරුදහන් වූ තැනැත්තන් පිළිබඳ කාර්යාලය නිහතමානීව ඉල්ලා සිටියේය.

2.53. අතුරුදහන් වූ තැනැත්තන් පිළිබඳ කාර්යාලය තවදුරටත් ඉල්ලා සිටියේ මෙවැනි චක්‍රලේඛයක් මගින් සියළුම මහේස්ත්‍රාත්වරුන්ට සහ උසාවියේ කාර්ය මණ්ඩලයට මහපෙන්වීමක් ලබා දෙන ලෙසත් අනුප්‍රාප්තික මහේස්ත්‍රාත්වරුන් භාරකාර ධුරාවලියට ඒකාකාර ප්‍රවේශයක් අනුගමනය කිරීම සහතික කරන ලෙසත් ය.

2.54. අධිකරණ වෛද්‍ය විද්‍යාවේ බහුවිධ විෂයයන් ඇතුළුව විද්‍යාත්මක හා විද්‍යාත්මක නොවන ක්‍රම උපයෝගී කරගනිමින් සාක්ෂි විශ්ලේෂණය කිරීම සඳහා, අවශ්‍ය පරිදි, සෑම මහේස්ත්‍රාත්වරයෙකුටම එවැනි චක්‍රලේඛයක් ලබා දෙන ලෙසත් ඉල්ලා සිටියේය.

3. විමර්ශන:

3.1. අතුරුදහන් වූවන් සෙවීම සහ සොයා ගැනීම සඳහා යාන්ත්‍රණයක් සැපයීම සහ එවැනි පුද්ගලයින් අතුරුදහන් වූ අවස්ථා පැහැදිලි කිරීම, අතුරුදහන් වූ තැනැත්තන් පිළිබඳ කාර්යාලයේ එක් අරමුණකි.[26] අතුරුදහන් වූ තැනැත්තන් පිළිබඳ කාර්යාලයේ බලතල අතර අතුරුදහන් වූවන් පිළිබඳ තොරතුරු ලබා ගැනීමේ බලය සහ මිනිස් මෘතදේහ කැණීම් හා ගොඩකිරීමේ ක්‍රියාවලිය නිරීක්ෂණය කිරීම සඳහා මහේස්ත්‍රාත් අධිකරණයකට අයදුම් කිරීමේ බලය ඇතුළත් වේ. මිනිස් මෘත දේහ හැසිරවීම සම්බන්ධයෙන් නිර්දේශ ඉදිරිපත් කිරීමට අතුරුදහන් වූ තැනැත්තන් පිළිබඳ කාර්යාලයට බලය ඇත. අතුරුදහන් වූ තැනැත්තන් පිළිබඳ කාර්යාලය එක දිගටම පුද්ගල පරීක්ෂණ ඉදිරියට ගෙන ගිය අතර මිනිස් මෘතදේහ සහ සැක සහිත සොහොන් බිම් පිළිබඳ ගැන මහේස්ත්‍රාත් පරීක්ෂණ සම්බන්ධව මහේස්ත්‍රාත් විමසුම් ද නිරීක්ෂණය කරයි..

3.2. අතුරුදහන් වූවන්ගේ පවුල් සහ රජයේ හා රාජ්‍ය නොවන සංවිධානයේ ඇතුළු විවිධ මූලාශ්‍රයන්ගෙන් අතුරුදහන් වූවන් පිළිබඳ කොරතුරු සහ පැමිණිලි අතුරුදහන් වූ තැනැත්තන් පිළිබඳ කාර්යාලය වෙත අඛණ්ඩව ලැබුණි. අතුරුදහන් වූ තැනැත්තන් පිළිබඳ කාර්යාල පනතේ 12 (ආ) (ii) සහ (iii) වගන්තිවලට අනුව, සැලකිය යුතු ලෙස ලේඛනගත කර ඇති සහ මහජන වැදගත්කමක් ඇති සිදුවීම්වල, අතුරුදහන් වීමේ රටාවන් සහ සන්දර්භයන් විශ්ලේෂණය කිරීමේ ක්‍රියාවලිය ඉදිරියට ගෙන ගියේ ය

3.3. පවුල් වලින් ලැබුණු ඉල්ලීම් මත පදනම්ව, අතුරුදහන් වූ තැනැත්තන් පිළිබඳ කාර්යාලය විසින් අතුරුදහන් වූ වූවන්ගේ සිද්ධීන් සම්බන්ධව අධිකරණ ක්‍රියාමාර්ග නිරීක්ෂණය කළේ ය.

හදුනානොගත් මෘත දේහ සොයා ගැනීම්

3.4. අතුරුදහන් වූ තැනැත්තන් පිළිබඳ කාර්යාලයේ විමර්ශන බලතල යටතේ, මිනිස් සිරුරු ගොඩගැනීමේදී හෝ කැණීම්වලදී නිරීක්ෂකයෙකු ලෙස කටයුතු කිරීම සහ එයට අදාළ අනෙක් කටයුතු සිදු කිරීම සඳහා මහේස්ත්‍රාත් අධිකරණයකට අයදුම් කිරීමට එයට බලය ඇත.[27] මිනිස් අවශේෂ හැසිරවීම සම්බන්ධයෙන්

[26] අතුරුදහන් වූ තැනැත්තන් පිළිබඳ කාර්යාල පනත, 2 (1) (අ) වගන්තිය, 10 (1) (අ) වගන්තිය
[27] අතුරුදහන් වූ තැනැත්තන් පිළිබඳ කාර්යාල පනත, 12 (ඇ) වගන්තිය.

රාජ්‍ය බලධාරීන්ට නිර්දේශ ඉදිරිපත් කිරීමටත්, අතුරුදහන් වූ සහ අතුරුදහන් වූවන්ගේ සහ ඔවුන්ගේ ඥාතීන්ගේ අයිතිවාසිකම් සහ උනන්දුව ආරක්ෂා කිරීමටත් එයට නිශ්චිත බලයක් ඇත.[28]

3.5. අතුරුදහන් වූ තැනැත්තන් පිළිබඳ කාර්යාලය, මිනිස් මෘතදේහ විමර්ශනය කෙරුණු අධිකරණ ක්‍රියාවලීන් පහක නිරීක්ෂක ලෙස කටයුතු කළේය; මන්නාරම මහේස්ත්‍රාත් අධිකරණයේ නඩු අංක B232/18 සහ B768/13; මුලතිව් මහේස්ත්‍රාත් අධිකරණයේ නඩු අංක AR/808/19 සහ AR/503/20; සහ කිලිනොච්චි මහේස්ත්‍රාත් අධිකරණයේ නඩු අංක B/542/20. අතුරුදහන් වූ තැනැත්තන් පිළිබඳ කාර්යාලය කලවංචිකුඩි මහේස්ත්‍රාත් අධිකරණයේ නඩු අංක B172/14 සම්බන්ධයෙන්ද මැදිහත් වී කටයුතු කළේ ය.

3.6. මේ සෑම අවස්ථාවකදීම අතුරුදහන් වූ තැනැත්තන් පිළිබඳ කාර්යාලය, විමර්ශනය සම්බන්ධව මිනිස් මෘතදේහ පිළිබඳ විශ්ලේෂණයක් සහ අධිකරණ පුරා විද්‍යාව සහ අධිකරණ මානව විද්‍යාව මත පදනම් සාක්ෂ්‍ය ඇතුළත් වන බහු ආංශික එළඹුමක් නිර්දේශ කළේ ය. එමෙන්ම එම ස්ථානයට යම් අයුරකින් බලපෑම් කරන සිදුවීම් සහිත ඉතිහාසය විමර්ශනයක් ද ඇතුළත් විය යුතු ය. විමර්ශනය අතරතුර මතු වූ සියලු සාක්ෂවල සහ පොලීසිය, අපරාධ ස්ථානය භාර නිලධාරීන් සහ අධිකරණ වෛද්‍ය නිලධාරී ඇතුළු විමර්ශන කණ්ඩායමේ සියලු සාමාජිකයින්ගේ සොයා ගැනීම්වල භාරකාර ධුරාවලිය ආරක්ෂා කිරීමට සුදුසු පියවර ගන්නා ලෙසටද අතුරුදහන් වූ තැනැත්තන් පිළිබඳ කාර්යාලය නිර්දේශ කර ඇත.

3.7. මන්නාරම නගරයේ සතොස ගොඩනැගිල්ල අසළ සැක කටයුතු සොහොන්බිම විමර්ශනය කෙරෙන නඩු අංක B232/18 දී 2020 මාර්තු 10 වන දින නීතිඥයින් විසින් නියෝජනය කෙරුණු පවුල්වල අයිතීන් නීතිපතිවරයාගේ නීතිඥයින් විසින් ප්‍රශ්න කිරීමකට ලක් කිරීමෙන් පසුව අතුරුදහන් වූවන්ගේ පවුල්වල සාමාජිකයින්ට නඩු අංක B232/18 සඳහා පෙනී සිටීමට අයිතියක් නැති බව මන්නාරම මහේස්ත්‍රාත්වරයා තීරණය කළේ ය.

3.8. 2020 මාර්තු 13 වන දින නඩු අංක B232/18 තුළ තම නීතිඥයින් විසින් නියෝජනය කෙරුණු පවුල් සාමාජිකයින් තිදෙනෙකු, වවුනියාව මහාධිකරණය ඉදිරියේ ප්‍රතිශෝධන අයදුම්පතක් ඉදිරිපත් කළ අතර, අතුරුදහන් වූ තැනැත්තන් පිළිබඳ කාර්යාලය එහි 2වන වග උත්තරකරු ලෙස නම් කර තිබිණි. අතුරුදහන් වූ තැනැත්තන් පිළිබඳ කාර්යාලය තම විරෝධය ඉදිරිපත් කළ අතර මිනිස් මෘතදේහ සම්බන්ධව මහේස්ත්‍රාත් විමසුම් සිදු කිරීමේදී නීතිඥයින් හරහා පෙනී සිටීමට අතුරුදහන් වූවන්ගේ පවුල්වලට ඇති අයිතිය සඳහා ප්‍රතිපත්තිමය ලෙස සහය ලබා දුනි. ප්‍රතිශෝධන අයදුම්පත සඳහා වන වාචික ඉදිරිපත් කිරීම 2021 පෙබරවාරි 10 දිනට නියමිතව ඇත.

4. දත්ත පදනම

4.1. අතුරුදහන් වූ තැනැත්තන් පිළිබඳ කාර්යාලයට, අතුරුදහන් වූවන් පිළිබඳ පැමිණිලි ලබාගැනීමට, දත්ත තුලනය කිරීමට සහ ඔවුන්ගේ තොරතුරු සහිත දත්ත පදනමක් ඇති කිරීමට බලය ඇත.[29] එමෙන්ම අතුරුදහන් වූ තැනැත්තන් පිළිබඳ කාර්යාලය, මූලාශ්‍රයන් ගණනාවක් වෙතින් ලබාගන්නා තොරතුරු සැකසීම, සනාථ කිරීම සහ ඇතුළත් කිරීම අඛණ්ඩව සිදු කරන ලදී. ඒ හා සමගාමීව අතුරුදහන් වූ තැනැත්තන් පිළිබඳ කාර්යාලය පවුල් සමග සන්නිවේදනය කරමින් කමන්ට අදාළ තොරතුරු ලැබුණු බව තහවුරු කිරීම ද සිදු කළේ ය. එමෙන්ම,පළමු වරට පුද්ගලයන් අතුරුදහන් වීමේ අවස්ථාවලට සම්බන්ධ තොරතුරු එක් රැස් කර අතුරුදහන් වූ හා දක්නට නොමැති පුද්ගලයන් පිළිබඳ පැමිණිලි සහ තොරතුරු ලැයිස්තුවක් පළ කිරීමෙන් එය මහජනතාව අතරට ගෙන යන ලදී[30].

---

[28] අතුරුදහන් වූ තැනැත්තන් පිළිබඳ කාර්යාල පනත, 13 (1)(iii), 10 (ඇ) වගන්තිය.

[29] අතුරුදහන් වූ තැනැත්තන් පිළිබඳ කාර්යාල පනත, 10 (1) (ඉ) වගන්තිය.

[30] අතුරුදහන් වූ තැනැත්තන් පිළිබඳ කාර්යාලයේ "අතුරුදහන් වූ තැනැත්තන් පිළිබඳ කාර්යාලයේ ප්‍රකාශන"" http://www.ompsrilanka.org/omp-documents/omp-publications 2020 දෙසැම්බර් 12 වන දින පිවිසිණි.

අතුරුදහන් වූවන් සම්බන්ධ පවත්නා දත්ත එක්රැස් කිරීම

4.2. අතුරුදහන් වූ තැනැත්තන් පිළිබඳ කාර්යාලයේ එක් අරමුණක් වන්නේ පනතේ 10 (1) (ඉ) වගන්තිය යටතේ දැනට සිදුකෙරෙන ක්‍රියාවලීන් හෝ වෙනත් ආයතන, සංවිධාන, රාජ්‍ය දෙපාර්තමේන්තු, විමසුම් කොමිෂන් සභා සහ විශේෂ ජනාධිපති විමසුම් කොමිෂන් සභා මගින් ලබාගන්නා අතුරුදහන් වූවන් පිළිබඳ දත්ත එක් රැස් කිරීමත් ඒවා අතුරුදහන් වූ තැනැත්තන් පිළිබඳ කාර්යාලය යටතේ ස්ථාපිත දත්ත පදනමක් තුළ මධ්‍යගත කිරීමත්ය.

4.3. අතුරුදහන් වූ තැනැත්තන් පිළිබඳ කාර්යාලය ස්ථාපිත කිරීමේ සිට එය ත්‍රිවිධ හමුදාව සහ පොලිසිය, වෙනත් රාජ්‍ය ආයතන, රාජ්‍ය නොවන සංවිධාන සහ බලහත්කාරී අතුරුදහන් කිරීම පිළිබඳ එක්සත් ජාතීන්ගේ ක්‍රියාකාරී කණ්ඩායම (UNWGIED) වෙතින් තොරතුරු ලබාගෙන තුලනය කර ඇත.

4.4. 2017 දී එවකට ජනාධිපති සිරිසේන අතිගරු ජනාධිපතිතුමාගේ උපදෙස් අනුව MNIR විසින් අතුරුදහන් වූවන්ගේ පවුල් අතර ප්‍රතිපෝෂණ දක්ත පත්‍රිකා බෙදා හැරියේය. සම්පූර්ණ කරන ලද ප්‍රතිපෝෂණ දක්ත පත්‍රිකා අදාළ දිස්ත්‍රික් ලේකම්වරුන් විසින් ප්‍රාදේශීය ලේකම්වරුන්ගේ සහාය ඇතිව MNIR වෙත යොමු කරන ලදී. සියලුම දිස්ත්‍රික්ක ආවරණය කරන ලද ප්‍රතිපෝෂණ දත්ත පත්‍රිකා 14,700 ක්[31] 2018 මාර්තු 15 දින අතුරුදහන් වූ තැනැත්තන් පිළිබඳ කාර්යාලය වෙත භාර දෙන ලදී. ආතුරුදහන් වූ පුද්ගලයන් සම්බන්ධ වැදගත් වාර්තා මූලාශ්‍රයක් වන්නේ පසුගිය විමසුම් කොමිෂන් සභා ය. අතුරුදහන් වූ පුද්ගලයන් පිළිබඳ කොමිෂන් සභා නවයක් පමණ පැවති අතර,[32] එයින් කිහිපයක්ම ප්‍රසිද්ධ වාර්තා පළ කර ඇත, තවත් කිහිපයක අවසන් වාර්තා තවමත් පළ කිරීමට නියමිතව ඇත.

4.5. අතුරුදහන් වූ සහ අතුරුදහන් වූවන්ගේ, ස්වේච්ඡාවෙන් ඉවත් කිරීම සහ අතුරුදහන් වීම් සම්බන්ධව විමසුම් කොමිෂන් සභා වාර්තා ජනාධිපති මුද්‍රාව යටතේ ජාතික ලේඛනාරක්ෂක දෙපාර්තමේන්තුවේ (DNA) වසර තිහක කාලයක් සඳහා ගබඩා කර ඇත. අතුරුදහන් වූ තැනැත්තන් පිළිබඳ කාර්යාලයේ 2019 වාර්ෂික වාර්තාව තුළ දැක්වූ පරිදි හිටපු ජනාධිපති මෛත්‍රීපාල සිරිසේන මහතාගේ ලේකම්වරුන්ගෙන්, අතීත විමසුම් කොමිෂන් සභාවල වාර්තාවලට පිවිසීම සඳහා අනුමැතීන් ලබාගන්නා ලදී.[33] 2019 මැයි 24 දිනැති ලිපිය මගින් DNA අයත්වන, නිවාස, ඉදිකිරීම් හා සංස්කෘතික කටයුතු අමාත්‍යාංශය, මෙම ව්‍යාපෘතිය ඉදිරියට ගෙන යන ලෙස DNA වෙත තවදුරටත් උපදෙස් ලබා දෙනු ලැබිණි.

4.6. මෙම අනුමත කිරීම් වලට අනුව, අතුරුදහන් වූ තැනැත්තන් පිළිබඳ කාර්යාලය 2019 ජූලි 22 දින DNA සමග අවබෝධතා ගිවිසුමකට එළඹිණි. කෙසේ වෙතත්, DNA වෙතින් නිසි පැහැදිලි කිරීමක්

---

[31] MNIR වෙතින් ලිපිගොනු 14,641 ක් අතුරුදහන් වූ තැනැත්තන් පිළිබඳ කාර්යාලයට ලැබී ඇති බව 2018 වාර්ෂික වාර්තාවේ 3.16 ඡේදයේ දැක්වෙයි. කෙසේ වෙතත්, අන්තර්ගතය සමාලෝචනය කිරීමෙන් පසුව සහ ගොනු ගණන නැවත ගණනය කිරීමෙන් පසුව එම අගය 14,700 දක්වා ඉහළ ගියේය.

[32] විමසුම් කොමිෂන් සභා නවය පහත පරිදි වේ: 2913 දී ස්ථාපිත කරන ලද අතුරුදහන් වූ තැනැත්තන් සම්බන්ධ පැමිණිලි විමර්ශනය කිරීම සඳහා වූ ජනාධිපති කොමිසම (පරණගම කොමිසම ලෙසද හැඳින්වේ; 2011 දී ස්ථාපිත උගත් පාඩම් සහ සංහිඳියා කොමිසම; 2006 දී ස්ථාපිත කළ දිවයින පුරා සිදුවන පැහැර ගැනීම්, අතුරුදහන් වීම් සහ සිවිල් වැසියන්ට මරණය ඇති කරන පහරදීම් පිළිබඳ ජනාධිපති විමසුම් කොමිසම (මහානාම තිලකරත්න කොමිසම ලෙස ද හැඳින්වේ); 1998 දී ස්ථාපිත පුද්ගලයන් අකමැත්තෙන් ඉවත් කිරීම සහ අතුරුදහන් වීම පිළිබඳ ජනාධිපති විමසුම් කොමිසම (සමස්ත ලංකා කොමිසම ලෙස ද හැඳින්වේ) 1995 දී ස්ථාපිත අතුරුදහන් කිරීම්, නීති විරෝධී අත් අඩගුවට ගැනීම් සහ බටලන්ද නිවාස යෝජනා ක්‍රමයේ රැඳවුම් කඳවුරක් පවත්වාගෙන යාම පිළිබඳ විමර්ශනය සඳහා වූ ජනාධිපති කොමිසම; මධ්‍යම, වයඹ, උතුරුමැද සහ ඌව පළාත්වල පුද්ගලයන් අකමැත්තෙන් ඉවත් කිරීම සහ අතුරුදහන් කිරීම පිළිබඳ ජනාධිපති විමසුම් කොමිසම (1994 දී ස්ථාපිත); 1994 දී ස්ථාපිත බස්නාහිර, දකුණ සහ සබරගමුව පළාත්වල පුද්ගලයන් අකමැත්තෙන් ඉවත් කිරීම සහ අතුරුදහන් කිරීම පිළිබඳ ජනාධිපති විමසුම් කොමිසම; 1991 දී ස්ථාපිත පුද්ගලයන් අකමැත්තෙන් ඉවත් කිරීම සහ අතුරුදහන් කිරීම පිළිබඳ ජනාධිපති විමසුම් කොමිසම, 1992 දී සහ 1993 දී නව නියෝග නිකුත් කෙරිණි.

[33] අතුරුදහන් වූ වාර්ෂික පිළිබඳ කාර්යාලය, අතුරු වාර්තාව (2019), 3.15 - 3.16. ඡේදය (වාර්ෂික වාර්තාව - 2019).

නොලැබුණු බැවින් අවබෝධතා ගිවිසුම ක්‍රියාත්මක කිරීමට අතුරුදහන් වූ තැනැත්තන් පිළිබඳ කාර්යාලයට හැකියාවක් නොලැබිණි.

4.7. අතුරුදහන් වූ තැනැත්තන් පිළිබඳ කාර්යාලයේ ඉල්ලීම්වලට ප්‍රතිචාර දක්වමින්, ක්‍රියාන්විතයේදී අතුරුදන් වූ යුධ කාර්ය මණ්ඩලයේ නම් ලැයිස්තුවක් ත්‍රිවිධ හමුදාව විසින් ලබා දෙන ලදී. ක්‍රියාන්විතයේදී අතුරුදන් වූවන් පිළිබඳ ලැයිස්තුව ශ්‍රී ලංකා පොලිසිය වෙතින් තවමත් ලැබී නැත. කෙසේ වෙතත්, ශ්‍රී ලංකා පොලිසිය වෙත අතුරුදහන් වූ බවට වාර්තා කරන ලද නම් ලැයිස්තු අතුරුදහන් වූ තැනැත්තන් පිළිබඳ කාර්යාලයට ලැබී ඇත.

4.8. අතුරුදහන් වූවන් සම්බන්ධයෙන් ශ්‍රී ලංකාවෙන් ලැබී ඇති සියලුම වාර්තා WGIED විසින් විදේශ කටයුතු අමාත්‍යාංශයට ඉදිරිපත් කර තිබේ. අතුරුදහන් වූවන් පිළිබඳ වාර්තා 12,664 ක් 2019 දී විදේශ කටයුතු අමාත්‍යාංශය විසින් අතුරුදහන් වූ තැනැත්තන් පිළිබඳ කාර්යාලයට යොමු කරන ලද අතර, එයට පැහැදිලි නොකළ වාර්තා 6,066 ක් සහ පැහැදිලි කළ වාර්තා 6,598 ක් ඇතුළත් වේ.[34]

4.9. අතුරුදහන් වූ තැනැත්තන් පිළිබඳ කාර්යාලයට එහි පිහිටවූ දින සිට 2020 දෙසැම්බර් 31 දින දක්වා අතුරුදහන් වූ හා දක්නට නොමැති පුද්ගලයන්ට අදාළව පහත වාර්තා ලැබී ඇත.

මූලාශ්‍රය	වාර්තා ගණන
අතුරුදහන් වූ තැනැත්තන් පිළිබඳ කාර්යාලයේ ප්‍රධාන කාර්යාලයට සෘජුවම ලැබුණු පැමිණිලි	1,377
අතුරුදහන් වූ තැනැත්තන් පිළිබඳ කාර්යාලයේ ප්‍රාදේශීය කාර්යාල හතරට සෘජුවම ලැබුණු පැමිණිලි	1,354
අතුරුදහන් වූ පුද්ගලයන් සම්බන්ධව MNIR වෙත ලැබුණු වාර්තාවන්	14,702
ක්‍රියාන්විතයේදී අතුරුදහන් වූ සන්නද්ධ හමුදා පිරිස්වල ලැයිස්තුව, ශ්‍රී ලංකා යුධ හමුදාවෙන් එවන ලදී.	3257
ක්‍රියාන්විතයේදී අතුරුදහන් වූ සන්නද්ධ නාවික පිරිස්වල ලැයිස්තුව, ශ්‍රී ලංකා නාවික හමුදාවෙන් එවන ලදී.	452
ක්‍රියාන්විතයේදී අතුරුදහන් වූ සන්නද්ධ ගුවන් පිරිස්වල ලැයිස්තුව, ශ්‍රී ලංකා ගුවන් හමුදාවෙන් එවන ලදී.	34
අතුරුදහන් වූ පුද්ගලයන් සම්බන්ධව ශ්‍රී ලංකා පොලිසියෙන් ලැබුණු වාර්තාවන්	5,307
අතුරුදහන් වූ පුද්ගලයන් සම්බන්ධව WGEID වෙතින් ලැබුණු වාර්තාවන්	12,664
එකතුව	**39, 417**

පැමිණිලි

4.10. අතුරුදහන් වූ පුද්ගලයෙකු සම්බන්ධ පැමිණිල්ලක්, එම පුද්ගලයාගේ ඥාතියෙකුගෙන්, වෙනත් පුද්ගලයෙකුගෙන් හෝ සංවිධානයකින් ලැබීමට අතුරුදහන් වූ තැනැත්තන් පිළිබඳ කාර්යාලයට බලය ඇත.[35]

---

[34] WGIED ට අනුව, අතුරුදහන් වූ පුද්ගලයෙකු පිළිබඳ වාර්තාවකට ප්‍රතිචාර වශයෙන් රජයක් තොරතුරු සැපයීමට අපොහොසත් වූ විට නඩු "පැහැදිලි නොකළ" ලෙස වර්ගීකරණය කළ යුතු ය. අතුරුදහන් වූ පුද්ගලයෙකුගේ ඉරණම පිළිබඳව රජයක් ප්‍රතිචාරයක් දක්වන විට වාර්තා "පැහැදිලි කළ " ලෙස වර්ගීකරණය කෙරේ.

[35] අතුරුදහන් වූ තැනැත්තන් පිළිබඳ කාර්යාලය, 12 වගන්තිය 12 (අ)

4.11. අතුරුදහන් වූ තැනැත්තන් පිළිබඳ ප්‍රධාන කාර්යාලය සහ ප්‍රාදේශීය කාර්යාල වෙත 2020 ජූනි 30 දින වන විට අතුරුදහන් වූ සහ අතුරුදහන් වූ පුද්ගලයින් පිළිබඳ පැමිණිලි 2731 ක් සෘජුවම ලැබී තිබේ. මෙයට 2020 ජනවාරි සිට ජූනි මාසය දක්වා අතුරුදහන් වූ තැනැත්තන් පිළිබඳ ප්‍රධාන කාර්යාලයට ලැබුණු ලිපි 622 ක් ද ඇතුළත් වේ. වසංගත තත්ත්වය හේතුවෙන් පැනවූ සීමාවන් නිසා කාර්ය මණ්ඩලය අඩු වීමත් සමග පැමිණිලි සම්බන්ධව කටයුතු කිරීමේ ප්‍රමාදයන් සිදු විය.

4.12. පැමිණිලි විභාග කිරීමේ ක්‍රියා පටිපාටිය අනුව අතුරුදහන් වූ තැනැත්තන් පිළිබඳ කාර්යාලය විසින් අතුරුදහන් වූවන්ගේ පවුල් සඳහා ලිඛිත තහවුරු කිරීමක් ලබා දිය යුතු අතර, අතුරුදහන් වූ හෝ අතුරුදහන් වූ පුද්ගලයින් පිළිබඳ තොරතුරු ලැබුණු බව පිළිගත යුතු ය. අතුරුදහන් වූ තැනැත්තන් පිළිබඳ කාර්යාලයට සෘජුවම ලැබුණු පැමිණිලි මෙන්ම 2018 මාර්තු මාසය වන විට MNIR වෙත යොමු කරන ලද පැමිණිලි සම්බන්ධයෙන් ද පිළිගැනීමේ ලිපි යවා ඇත. අතුරුදහන් වූ තැනැත්තන් පිළිබඳ කාර්යාලයේ නියමු අතුරු වාර්තා ව්‍යාපෘතියේ කොටසක් ලෙස, 2020 ජනවාරියේදී, මහනුවර සහ ගම්පහ දිස්ත්‍රික්කයෙන් තෝරාගත් පවුල් සඳහා පිළිගැනීමේ ලිපි සමග අතුරු වාර්තා ඉල්ලා සිටින ලෙස අයදුම්පත් යවා ඇත.

4.13. අතුරුදහන් වූ තැනැත්තන් පිළිබඳ කාර්යාලය විසින් 2020 දෙසැම්බර් 30 දින වන විට පවුල් වෙත පැමිණිලි ලැබුණු බවට පිළිගැනීමේ ලිපි 6,639 ක් යවා ඇත. තවත් ලිපි 9.501 ක් පවුල් වෙත යැවීමට නියමිතව ඇත. මේ සම්බන්ධව කටයුතු කිරීමේදී දෙමළ භාෂාව කථා කරන කාර්ය මණ්ඩලය අඩු වීම විශාල බාධාවක්ව ඇත. ලැබුණු බවට දන්වා යවන ලිපියේ විස්තර පහත දැක්වේ.

දිස්ත්‍රික්කය	ලැබුණු පැමිණිලි ගණන	ලැබුණු බවට දන්වා යැවූ පැමිණිලි ගණන	ලැබුණු බවට දන්වා යැවීමට නියමිත පැමිණිලි ගණන
අම්පාර	519	102	417
අනුරාධපුරය	279	279	00
බදුල්ල	5	5	00
මඩකලපුව	5684	00	5684
කොළඹ	116	116	00
ගාල්ල	263	263	00
ගම්පහ	250	249	1
හම්බන්තොට	183	182	1
යාපනය	1974	1974	0
කලුතර	190	190	0
මහනුවර	623	623	00
කෑගල්ල	108	108	00
කිලිනොච්චි	1125	0	1125
කුරුණෑගල	428	428	00
මන්නාරම	356	353	3
මාතලේ.	302	302	00

මාතර	346	346	00
මොණරාගල	45	44	1
මුලතිවු	531	400	131
නුවරඑළිය	15	14	01
පොළොන්නරුව	364	364	00
පුත්තලම	81	81	00
රත්නපුර	216	216	00
ත්‍රිකුණාමලය	1517	0	1517
වවුනියාව	620	0	620
එකතුව	**16140**	**6639**	**9501**

4.14. අතුරුදහන් වූ කැනැත්තන් පිළිබඳ කාර්යාලයේ ප්‍රධාන කාර්යාලය වෙත පැමිණි පවුල් ගණන පහත දක්වා ඇත.

මාසය	ලැබුණු පැමිණිලි ගණන
ජනවාරි	22
පෙබරවාරි	
මාර්තු	
අප්‍රේල්	
මැයි	
ජූනි	
ජූලි	
අගෝස්තු	
සැප්තැම්බර්	07
ඔක්තෝබර්	05
නොවැම්බර්	00
දෙසැම්බර්	01
එකතුව	35

අතුරුදහන් පුද්ගලයන්ගේ දත්ත ආකෘති පත්‍රය

4.15. අතුරුදහන් වූවන්ගේ තොරතුරු රැස් කිරීම සඳහා අතුරුදහන් වූ කැනැත්තන් පිළිබඳ කාර්යාලය විසින් භාවිතා කළ අතුරුදහන් වූවන්ගේ දත්ත ආකෘතිය අදියර කිහිපයකට බලපෑ වී ඇත. මුලදී, ජනාධිපති ලේකම් කාර්යාලය සහ MNIR විසින් සකස් කරන ලද ආකෘතිය අතුරුදහන් වූ කැනැත්තන් පිළිබඳ කාර්යාලය විසින් භාවිතා කරන ලදී.

4.16. කෙසේ වෙතත්, මෙම ආකෘති පත්‍රයේ සීමාවන් හඳුනාගෙන, වෙනත් රටවල ඒ හා සමාන අනිවාර්ය ආයතන විසින් සම්මත කර ඇති ප්‍රමිති සැලකිල්ලට ගනිමින් හා දත්ත කළමනාකරණ උපදේශකවරයෙකුගේ උපදෙස්, ක්ෂේත්‍ර මට්ටමින් කාර්ය මණ්ඩලයෙන් ප්‍රතිචාර, සහ පවුල් වල අදහස් යොදා ගනිමින් අතුරුදහන් වූවන්ගේ නව විස්තර සහිත දත්ත ආකෘති පත්‍රයක් සැලසුම් කරන

ලදී; උපරිම තොරතුරු රැස් කිරීම සඳහා මෙවලම් පත්‍රයක් සංවර්ධනය කිරීමට පදනම් වූයේ වසරින් වසර අතුරුදහන් වූවන්ගේ මෙම පවුල් සාමාජිකයින් ගණන වැඩිවීම සහ ඉදිරියේදී තොරතුරු එක් රැස් කිරීම සඳහා අතුරුදහන් වූ තැනැත්තන් පිළිබඳ කාර්යාලයට නොහැකි වීමට ඉඩ ඇති බැවිනි.

4.17. 2018 වසරේදී ආකෘති පත්‍ර ක්‍රියාවට නගන ලදී ලැබුණු ප්‍රතිපෝෂණයෙන් දැක්වුණේ ආකෘති ඉතා සවිස්තරාත්මක වන බවත් සම්පූර්ණ කිරීමට දීර්ඝ කාලයක් ගතවන වන අකර එනිසාම ක්ෂේත්‍ර පිළිතුරු නොදී හිස්ව තැබීමට හේතු වන බවත් ය. ආකෘති පත්‍රය සැලසුම් කර ඇත්තේ අතුරුදහන් වූ තැනැත්තන් පිළිබඳ කාර්යාලයේ නිලධාරියෙකු විසින් ඉතා මැනවින් හැසිරවීම සඳහා වුවත්, කාර්යාලය රට පුරා ව්‍යාප්තව නොමැති බැවින් මෙය ප්‍රායෝගික දුෂ්කරතා ඇති කළේය.

4.18. මෙම අභියෝගය ජය ගැනීම සඳහා, අතුරුදහන් වූ තැනැත්තන් පිළිබඳ කාර්යාලය, අතුරුදහන් වූවන් සම්බන්ධ තොරතුරු එක්රැස් කිරීමේ මූලික මෙවලමක් ලෙස වඩා සරල ආකෘති පත්‍රයක් සංවර්ධනය කළ අතර එය අනෙක් තොරතුරු එක් රැස් කිරීමේ මෙවලම් සමඟ භාවිතා කළ හැකි විය. එය සංවර්ධනය කරනු ලැබුවේ අතුරුදහන් වූ තැනැත්තෙකු පිළිබඳව වාර්තා කිරීමට අවශ්‍ය අවම තොරතුරු පිළිබඳව ජාත්‍යන්තරව පිළිගත් ප්‍රමිතීන්ට සහ ශ්‍රී ලංකාවට සුවිශේෂී වූ සන්දර්භයන් සහ අවශ්‍යතාවයන්ට අනුකූලවයි. අතුරුදහන් වූවන් පිළිබඳ සරල දත්ත ආකෘති පත්‍රය අතුරුදහන් වූ තැනැත්තන් පිළිබඳ කාර්යාලයීය මණ්ඩලය විසින් අනුමත කරනු ලදුව සිංහල , දෙමළ සහ ඉංග්‍රීසි භාෂාවෙන් ලබා දෙන ලදී.

4.19. 2019 දී ලැබුණු ප්‍රතිචාර මත පදනම්ව, අතුරුදහන් වූ පුද්ගලයන්ගේ දත්ත ආකෘති පත්‍රයේ සුළු සංශෝධන සහිතව යාවත්කාලීන කරන ලද අනුවාදයක් 2020 සැප්තැම්බර් මාසයේදී අවසන් කරන ලද අතර එය සිංහල, දෙමළ සහ ඉංග්‍රීසි යන භාෂා වල භාවිතය සඳහා අනුමත කරන ලදී.

4.20. තාවකාලික ලැයිස්තුව සත්‍යාපනය කිරීමේදී, නව ආකෘති පත්‍ර ඉල්ලා සිටි අදාළ පවුල් සාමාජිකයින්ට අතුරුදහන් වූ පුද්ගලයන්ගේ දත්ත ආකෘති පත්‍ර 149 ක් ලබා දීමට අතුරුදහන් වූ තැනැත්තන් පිළිබඳ කාර්යාලයට හැකි ය.[36]

දත්ත පදනම්

4.21. අතුරුදහන් වූ තැනැත්තන් පිළිබඳ කාර්යාල පනත යටතේ, අතුරුදහන් වූවන්[37] පිළිබඳ සියලු තොරතුරු ඇතුළත් විය යුතු දත්ත සමුදායක් නිර්මාණය කිරීමට, කළමනාකරණය කිරීමට හා නඩත්තු කිරීමට මෙන්ම එහි සියලුම දත්ත පදනම් සහ දත්තවල ආරක්ෂාව තහවුරු කිරීම සඳහා අවශ්‍ය වන සියලුම පියවරයන්, තාක්ෂණික ආරක්ෂාවන්ද ඇතුළුව, ගැනීමට අතුරුදහන් වූ තැනැත්තන් පිළිබඳ කාර්යාලට අධිකාරියේ ඇත.[38]

4.22. අතුරුදහන් වූ තැනැත්තන් පිළිබඳ කාර්යාලය විසින් අතුරුදහන් වූ පුද්ගලයින්, සිදුවීම් සහ සොහොන් බිම් සම්බන්ධ ලේඛන තුනකින් සමන්විත තාවකාලික දත්ත ගබඩාවක් නිර්මාණය කර ඇති අතර, පැමිණිලිකරුවන්ගෙන් සහ අතුරුදහන් වූවන්ගේ පවුල්වලින් ලබාගත් දත්ත ඒකාබද්ධ කිරීමේ ක්‍රියාවලිය ආරම්භ කර නිබෙ. තවද, අතුරුදහන් වූ තැනැත්තන් පිළිබඳ කාර්යාලය පුළුල් හා ස්ථිර දත්ත සමුදායක් සඳහා අවශ්‍යතා සිතියම් ගත කරමින් සිටී. අතුරුදහන් වූ තැනැත්තන් පිළිබඳ කාර්යාලයට සමාන කාර්ය නියමයක් ඇති වෙනත් අධිකරණ බලප්‍රදේශවල ආයතන විසින් සංවර්ධනය කරන ලද දත්ත පදනම් විමර්ශනය කරන ලදී. අතුරුදහන් වූවන් සෙවීමේදී අතුරුදහන් වූ තැනැත්තන් පිළිබඳ කාර්යාලය ජාත්‍යන්තර විශේෂඥයන්ගෙන් උපදෙස් ලැබූ අතර එම විමර්ශනයන් සාර්ථක කරගැනීම

[36] තාවකාලික ලැයිස්තුව පිළිබඳ වැඩිදුර විස්තර සඳහා පහත 4.34 ඡේදය බලන්න.
[37] අතුරුදහන් වූ තැනැත්තන් පිළිබඳ කාර්යාල පනත 13 (1) (ඒ)
[38] අතුරුදහන් වූ තැනැත්තන් පිළිබඳ කාර්යාල පනත 15 (3)

සඳහා හා තනි සිදුවීම් කළමනාකරණය කිරීමේ මෙවලමක් ලෙස දත්ත පදනමක් නිර්මාණය කරගැනීම සඳහා දේශීය දත්ත පදනම් විශේෂඥයින්ගෙන් ද උපදෙස් ලබන ලදී.

4.23. කාර්ය මණ්ඩලයේ කිහිප දෙනෙකු ඉල්ලා අස්වීම සහ කොන්ත්‍රාත් කාලය අවසන් කළ බැවින් 2020 වසර තුළ දත්ත ඒකකය විශාල මානව සම්පත් අර්බුදයකට මුහුණ දුන්නේ ය. එමෙන්ම අතුරුදහන් වූ තැනැත්තන් පිළිබඳ කාර්යාලය සතු දත්ත බොහොමයක් දෘඪ පිටපත් ආකාරයෙන් පවතින බැවින් රට වසා දැමීමේ තත්ත්වයන් තුළ එහි වැඩ කටයුතු සිදු කිරීම අසීරු විය. මෙම අභියෝගයන්ට මුහුණ දීම පිණිස දත්ත සැකසුම් කිරීම සඳහා ප්‍රාදේශීය කාර්ය මණ්ඩලය යොදා ගැනීමට අධ්‍යක්ෂ මණ්ඩලය තීරණය කළේ ය. කොමසාරිස්වරුන් සහ ප්‍රධාන කාර්යාලයේ කාර්ය මණ්ඩලය ප්‍රාදේශීය කාර්යාල වෙත ගොස් එහි සිටින පිරිස්වලට දත්ත සැකසුම් කිරීමේ පුහුණුව ලබා දුන්නේ ය.

4.24. 2018 සිට, අතුරුදන් වූ තැනැත්තන් පිළිබඳ කාර්යාලය පවුල් වෙතින් සෘජුවම ලැබුණු දත්ත සහ ආයතනවලින් යොමු කෙරුණු දත්ත ඒකාබද්ධ කිරීමේ ක්‍රියාවලියේ නිරත වෙයි. අතුරුදහන් වූ පුද්ගලයන් සම්බන්ධ තොරතුරු ලැබීමත් සමඟ අතුරුදන් වූ තැනැත්තන් පිළිබඳ කාර්යාලය තම දත්ත පද්ධතියට ඒවා ඇතුළු කිරීමට පෙර සමාලෝචන ක්‍රියාවලියක නිරත වෙයි. මෙහිදී ලැබුණු තොරතුරුවල නිරවද්‍යතාව සමාලෝචනය කරන අතර අතුරුදහන් වීම මෙම කාර්යාලයේ වගකීමට යටත් ක්ෂේත්‍රයකට අයත් වන්නේ ද යන්නත් එය පවතින තොරතුරක් නැවත ඇතුළත් කිරීමක් ද යන්න පරීක්ෂා කෙරේ.

4.25. පැමිණිල්ල තුළ සටහන් වන කරුණු අනුව එය අතුරුදන් වූ තැනැත්තන් පිළිබඳ කාර්යාලයට අයත් ක්ෂේත්‍රයක සිදුවීමක් ද එහි කාලය හා ස්ථානය යනාදී සියල්ල පරීක්ෂාවට බඳුන් වේ. එම අතුරුදහන් වීම අතුරුදන් වූ තැනැත්තන් පිළිබඳ කාර්යාලය සතු වගකීමකට යටත් නොවන්නක් නම්, ඒ පිළිබඳව පැමිණිලිකරුට දන්වා සිටින අතර එයට අදාළ වෙනත් රජයේ ආයතනයක් ඇත්නම් ඒ පිළිබඳව තොරතුරු ලබා දෙනු ලබයි. එවන් අවස්ථාවන්හිදී, එම අතුරුදහන් වීම අතුරුදන් වූ තැනැත්තන් පිළිබඳ කාර්යාලය වග කියන ක්ෂේත්‍රයට අයත් බව තහවුරු කිරීමට පැමිණිලිකරුට අවස්ථාව ඇත. අදාළ පැමිණිල්ල සම්බන්ධ තොරතුරු මඳ වීම මත ඒ පිළිබඳව තීරණයක් ගත නොහැකි නම් අතුරුදන් වූ තැනැත්තන් පිළිබඳ කාර්යාලය පවුල්වලින් වැඩි දුර තොරතුරු ඉල්ලා සිටී.

4.26. ඉහත දක්වා ඇති පරිදි, අතුරුදහන් වූ තැනැත්තන් පිළිබඳ කාර්යාලය අතුරුදහන් වූ පුද්ගලයන් සම්බන්ධ වාර්තා 39,416 ක් සැකසීමේ නියැලී සිටී. අතුරුදහන් වූවන් පිළිබඳ වාර්තා 21,175 ක් 2020 දෙසැම්බර් 31 දින වන විට අතුරුදහන් වූ තැනැත්තන් පිළිබඳ කාර්යාලය සිය දත්ත ගබඩාවට ඇතුළත් කර ඇත.

4.27. ලැබුණු පැමිණිලිවල අවම තොරතුරු දත්ත පදනමට ඇතුළත් කෙරෙන බව සහතික කිරීමට, 2020 ජනවාරි දත්ත සැකසීමට වෙනත් ඒකකවලින් තාවකාලිකව කාර්ය මණ්ඩලය වෙන් කරගෙන අවශ්‍ය කාර්ය මණ්ඩලය අතිකාල සේවා සඳහාද යොදවාගනිමින් අතුරුදහන් වූ තැනැත්තන් පිළිබඳ කාර්යාලය දත්ත ඇතුළත් කිරීමේ ක්‍රියාවලිය අබණ්ඩවම වෙගවත් කරන ලදී.

පැමිණිලි ලැයිස්තුව සහ අතුරුදහන් වූ පුද්ගලයන් පිළිබඳ තොරතුරු

4.28. රහස්‍යභාවය සහ දත්ත ආරක්ෂා කිරීම සම්බන්ධ අදාළ සියලු නීතිරීති සැලකිල්ලට ගෙන අතුරුදහන් වූවන්ගේ ගැටලු පිළිබඳ මහජන දැනගැනීම සඳහා තොරතුරු ප්‍රකාශයට පත් කිරීමේ බලය අතුරුදහන් වූ තැනැත්තන් පිළිබඳ කාර්යාලයට ඇත.[39]

[39] අතුරුදහන් වූ තැනැත්තන් පිළිබඳ කාර්යාල පනත, 13 (1)(ඔ)(v)

4.29. 2020 නොවැම්බරයේදී අතුරුදහන් වූ තැනැත්තන් පිළිබඳ කාර්යාලය විසින් "අතුරුදහන් වූ සහ අතුරුදන් වූවන් සම්බන්ධයෙන් ලැබී ඇති පැමිණිලි සහ තොරතුරු ලැයිස්තුව" (ලැයිස්තුව) ප්‍රකාශයට පත් කළේ ය.[40] මෙම ලැයිස්තුව සංවර්ධනය කරන ලද්දේ 2020 පෙබරවාරි මාසයේදී තහවුරු කිරීමේ අරමුණින් ප්‍රසිද්ධ නොකරන අයුරින් සකසන ලද අතුරුදහන් වූ පුද්ගලයන් පිළිබඳ යාවකාලික ලැයිස්තුව මත පදනම් වෙමිනි.

4.30. පසුගිය විමසුම් කොමිෂන් සභා මගින් තම වගකීමට යටත් වන ක්ෂේත්‍රයන්ට අදාළව අතුරුදහන් වූවන්ගේ ලැයිස්තු සකසන ලද නමුදු ඉන් පළ කරන ලද්දේ කිහිපයක් පමණි.[41] එමෙන්ම, එක් එක් විමසුම් කොමිෂන් සභා ඒවායේ කාල සීමාව, සන්දර්භය සහ ප්‍රදේශය අනුව සීමා වීමකට ලක් විය. මෙම කොමිෂන් සභා සහ වෙනත් රාජ්‍ය ආයතන මගින් එක් රැස් කරන ලද දත්ත, අතුරුදහන් වූවන් පිළිබඳ තොරතුරු සහිත එක් කෝෂ්ඨාගාරයකට ඒකාබද්ධ කර නොතිබිණි.

4.31. අතීත ව්‍යායාමයන් මෙන් නොව අතුරුදහන් වූ තැනැත්තන් පිළිබඳ කාර්යාලයේ සුවිශේෂී විධි නියෝගය අනුව එහි දත්ත ඒකාබද්ධ කිරීමේ කාලය, සන්දර්භය සහ ප්‍රදේශය සීමා වීමකට ලක් නොවේ.

4.32. අතුරුදහන් වූවන්ගේ තොරතුරු, ලැයිස්තුගත කිරීම මගින් අතුරුදහන් වූ තැනැත්තන් පිළිබඳ කාර්යාලයට අතුරුදහන් වූ පුද්ගලයන් හඳුනා ගැනීමට සහ එහි විධිනියෝගයට යටත් ව ලංකාව තුළ ඇති සිද්ධීන් පිළිබඳ පුළුල් ලැයිස්තුවක් සකස් කිරීමට හැකි වේ. එමෙන්ම එමගින්, සේවාවන් සහන හෝ වන්දිපූරණ සැපයීමට හෝ ඒ සඳහා පහසුකම් සැපයීමට, රටාවන්, නිශ්චිත සිදුවීම් හා සන්දර්භයන්ට අදාළව උල්ලංඝනය කිරීම් සහ අතුරුදහන් කිරීම්වල ස්වභාවය හඳුනාගැනීමට, අභ්‍යන්තර ක්‍රියාවලීන් සංවර්ධනය කිරීමට; සහ ඉලක්කගත මැදිහත් වීම් කිරීම සහ නිර්දේශ ඉදිරිපත් කිරීම සඳහා අතුරුදහන් වූ පුද්ගල කාණ්ඩවලට පැතිකඩ සැකසීමට හැකියාව ලැබේ. අතුරුදහන් වූවන්ට අදාළ වාර්තා ඒකාබද්ධ කිරීමට වෙනත් රටවල් ගෙන ඇති ක්‍රියාමාර්ග සැලකිල්ලට ගනිමින්, විස්තීර්ණ නිල වාර්තාවක් සැකසීමේ ක්‍රියාවලිය සඳහා වසර කිහිපයක් ගත වනු ඇති බව අතුරුදහන් වූ තැනැත්තන් පිළිබඳ කාර්යාලය පිළිගනී. අතුරුදහන් වූ තැනැත්තන් පිළිබඳ කාර්යාලය විසින් පළ කරන ලද ලැයිස්තුව, ශ්‍රී ලංකාව තුළ අතුරුදහන් වූවන් සම්බන්ධ වඩා විස්තීර්ණ, නිල වාර්තාවක් තැනීම වෙත වන වැදගත් පියවරකි.

4.33. 2020 පෙබරවාරි මාසයේදී, අතුරුදහන් වූ තැනැත්තන් පිළිබඳ කාර්යාලය තාවකාලික ලැයිස්තුවක් ප්‍රකාශයට පත් කළ අතර තම ආදරණීයයන්ගේ අතුරුදහන් වීම පිළිබඳ තොරතුරු සමාලෝචනය කිරීම සඳහා සහ තාවකාලික ලැයිස්තුවට නම් ඇතුළත් නොකළ අතුරුදහන් වූවන් සම්බන්ධව වාර්තා කිරීමට එම පවුල්වලට ඇරයුම් කළේ ය.[42] තාවකාලික ලැයිස්තුවේ පිටපත් ප්‍රධාන සහ ප්‍රාදේශීය කාර්යාලවලට ලබා දෙන ලදී. තොරතුරු සමාලෝචනය කිරීමට සහ යම් ගැටළුවක් ඇත්නම් ඒ සම්බන්ධව පහසුවෙන් පිවිසීම සහතික කිරීම සඳහා කාර්යාල වෙතට පැමිණෙන ලෙස පවුල්වලට ඇරයුම් කරන ලද අතර එසේ නැතිනම් දූරකථනය මගින් සම්බන්ධ කර ගන්නා ලදී. ලැයිස්තුවට ඇතුළත්ව ඇති අතුරුදහන් වූ පුද්ගලයකුගේ ඉරණම සම්බන්ධව පොදු ජනතාව අතර යම් කෙනෙකු සතුව තොරතුරු ඇත්නම් එම තොරතුරු ද අතුරුදහන් වූ තැනැත්තන් පිළිබඳ කාර්යාලය වෙත ලිඛිතව දැනුම් දෙන ලෙස දිරිගන්වනු ලැබේ. මෙම සත්‍යාපන ක්‍රියාවලිය, කොවිඩ් 19 වසංගත තත්ත්වය හේතුවෙන් මාර්තු මසදී රට සම්පූර්ණයෙන් වසා දමන තෙක් සිදු කරගෙන යන ලදී.

---

[40] අතුරුදහන් වූ තැනැත්තන් පිළිබඳ කාර්යාලයේ ප්‍රකාශන http://www.ompsrilanka.org/omp-documents/omp-publications 2021 ජනවාරි 29 දින පිවිසිණි.

[41] බස්නාහිර, දකුණ සහ සබරගමුව පළාත්වල අකමැත්තෙන් ඉවත් කරන ලද හෝ අතුරුදහන් වූ පුද්ගලයන් පිළිබඳ විමසුම් කොමිසමේ අවසන් වාර්තාව, II වෙළුම, සැපි පත්‍රිකා අංක V (1997) "අතුරුදහන් වූවන්ගේ නම් ලැයිස්තුව" බලන්න.

[42] අතුරුදහන් වූ තැනැත්තන් පිළිබඳ කාර්යාලය, "මාධ්‍ය ප්‍රකාශය -අතුරුදහන් වූ තැනැත්තන් පිළිබඳ කාර්යාලය: අතුරුදහන් වූ තැනැත්තන්ගේ අතුරු ලැයිස්තුව සනාථ කරගැනීම" (2020 පෙබරවාරි 9) <https://twitter.com/ompsrilanka/status/1226367749380767744/photo/1> 2020 නොවැම්බර් මස 9 දින පිවිසිණි

4.34. ඒ අතරම, අතුරුදහන් වූ තැනැත්තන් පිළිබඳ කාර්යාලය, දත්ත පදනම සහ භෞතිකව ඇති ගොනු හෝ ලැයිස්තු සමග සසඳමින් සහ සම්බන්ධ කරමින්, වාර්තා දෙවරක් සටහන් වීම වලක්වමින් සහ කාර්යාලයේ විධිනියෝගයන්ට අයත්වන සිදුවීම් හඳුනාගනිමින් පියවර කිහිපයකින් යුතු අභ්‍යන්තර ක්‍රියාවලියක් ද ක්‍රියාත්මක කළේ ය. දත්ත කළමනාකරණ ඒකකය, දිස්ත්‍රික්ක 22 කට අදළව දෙවරක් ඇතුළත් වූ සිදුවීම් 809 ක් හඳුනාගනු ලැබුවේ ය.

4.35. අතුරුදහන් වීම් සම්බන්ධ සිදුවීම් ඇගයීමට ලක් කරන ලද්දේ පවුල් විසින් සපයන ලද කරුණු පදනම් කරගෙන වූ අතර 2020 දෙසැම්බර් 31 වන විට දිස්ත්‍රික්ක 22 ක සිදුවීම් 151 ක් අතුරුදහන් වූ තැනැත්තන් පිළිබඳ කාර්යාලයේ විධිනියෝගයට ඇතුලත් නොවන බැවින් ඉවත් කරන ලදී. අතුරුදහන් වූ තැනැත්තන් පිළිබඳ කාර්යාල පනතේ 27 වන වගන්තිය යටතේ යුධ ගැටුම්, දේශපාලන කැළඹිලි හෝ සිවිල් කලකෝලාහල සම්බන්ධ අතුරුදහන් වීම් සහ ක්‍රියාන්විතයේදී අතුරුදහන් වූ ත්‍රිවිධ හමුදා හෝ පොලීසියේ කාර්ය මණ්ඩලය අතුරුදහන් වූ තැනැත්තන් පිළිබඳ කාර්යාලයේ විධිනියෝගයන් යටතට ඇතුළත් වේ. ලැයිස්තුවේ සඳහන් වන්නේ පැහැදිලිවම මෙම සීමාවේ පවතින සිදුවීම් සහ අතුරුදහන් වූ තැනැත්තන් පිළිබඳ කාර්යාලයේ විධිනියෝගයට අයත් වන්නේදැයි තීරණය කිරීම පිණිස වැඩි දුර පැහැදිලි කිරීම් අවශ්‍ය සිදුවීම් ය. පැහැදිලි ලෙසම මෙම සීමාවෙන් පිටතට අයත් වන සිදුවීම්, උදාහරණයක් ලෙස සුනාමි ව්‍යසනය හෝ පැහැර ගැනීම් හෝ අකමැත්තෙන් ඉවත් කිරීම යනාදි ලක්ෂණ කිසිවක් නොමැති අධිකරණ බාහ්‍ය චින්දිතයන් සහිත සිදුවීම් මෙයින් ඉවත් කෙරේ.

4.36. එසේ අතුරුදහන් වූ තැනැත්තන් පිළිබඳ කාර්යාලයේ විධිනියෝගයට අයත් නොවන සිදුවීම් එම අදාළ පවුල්වලට දැනුම් දෙන අතර එය එසේ නොවන බවට තහවුරු කිරීමට වැඩි දුර තොරතුරු සපයන ලෙස ඉල්ලා සිටිනු ලැබේ. ලැයිස්තුවේ ඇති සමහර තොරතුරු සම්බන්ධව විස්තරාත්මක තොරතුරු ඇතුළත් නොවන බැවින් අමතර තොරතුරු ලබාගැනීමටඅතුරුදහන් වූ තැනැත්තන් පිළිබඳ කාර්යාලය පවුල් හා සම්බන්ධ වේ.

4.37. කොවිඩ් 19 වසංගත තත්ත්වයත් සමග ලැයිස්තුව සැකසීමේ කටයුතුවලට බාධාවන් එල්ල විය. එයට හේතු වූයේ රට වසා දැමීම්, නිවසේ සිට වැඩ කිරීමට අදාළ රෙගුලාසි පැනවීම සමග කාර්ය මණ්ඩලයට ලිපිගොනු ආශ්‍රිතව වැඩකටයුතු කිරීමට නොහැකි වීමයි.

4.38. මෙම අභියෝග මධ්‍යයේ, මඩකලපුව දිස්ත්‍රික්කය හැර සෙසු දිස්ත්‍රික්කවලට අදාළ ව ක්‍රියාන්විතයේදී අතුරුදහන් වූ පුද්ගලයින් පිළිබඳ සන්නද්ධ හමුදාව විසින් ලබා දුන් දත්ත සමග අතුරුදහන් වූ සහ අතුරුදන් වූවන් පිළිබඳ පැමිණිලි සහ තොරතුරු ලැයිස්තුව 2020 නොවැම්බර් 26[43] දින ප්‍රකාශයට පත් කරන ලදී. අතුරුදහන් වූ තැනැත්තන් පිළිබඳ කාර්යාලයේ දත්ත ගබඩාවේ සටහන් වූ අතුරුදහන් වීමේ සිද්ධීන් 19,013 ක විස්තර මෙම ලැයිස්තුවේ ඇතුළත් වේ. වැඩිම තොරතුරු ප්‍රමාණයක් අඩංගු මඩකලපුව දිස්ත්‍රික්කයේ පැමිණිලි සහ තොරතුරු 2021 මුල් භාගයේදී ප්‍රකාශයට පත් කෙරේ.

4.39. අඛණ්ඩතාව පවත්වා ගැනීමේ අරමුණින්, අතුරුදහන් වූ තැනැත්තන් පිළිබඳ කාර්යාලය විසින් 2020 ජූලි 31 න් පසු ලැබුණු දත්ත ලැයිස්තුවට ඇතුළත් කර නැති අතර, ලැයිස්තුව යාවත්කාලීන කළ විට ඇතුළත් කෙරෙනු ඇත. අතුරුදහන් වූ තැනැත්තන් පිළිබඳ කාර්යාලයේ අවධානයට නව තොරතුරු ගෙන ආ විට දත්ත කළමනාකරණ ඒකකය විසින් දත්ත ගබඩාව යාවත්කාලීන කිරීම අඛණ්ඩව සිදු කෙරේ.

[43] අතුරුදහන් වූ තැනැත්තන් පිළිබඳ කාර්යාලය, මාධ්‍ය ප්‍රකාශය -අතුරුදහන් වූ තැනැත්තන් පිළිබඳ කාර්යාලය: අතුරුදහන් වූ පුද්ගලයන් සම්බන්ධව අතුරුදහන් වූ තැනැත්තන් පිළිබඳ කාර්යාලයට ලැබුණු පැමිණිලි සහ තොරතුරු ලැයිස්තුව https://twitter.com/ompsrilanka/status/1331909597460713472/photo/1 සහ https://twitter.com/ompsrilanka/status/1331909597460713472/photo/2 2020 දෙසැම්බර් 2 පිවිසිණි.

4.40. මෙම ලැයිස්තුව සම්පාදනය කිරීමේදී, අතුරුදහන් වූ තැනැත්තන් පිළිබඳ කාර්යාලය පළමුවැනි, ත්‍රිවිධ හමුදාවෙන් සහ ජාතික ඒකාබද්ධතා, ප්‍රතිසංධාන, රාජ්‍ය භාෂා, සමාජ ප්‍රගමන සහ හින්දු ආගමික කටයුතු අමාත්‍යාංශය වෙතින් ලද දත්ත භාවිත කළේ ය. විනිදිත සහ පවුල් සහාය ඒකකය සහ ප්‍රාදේශීය කාර්යාල සමඟ සහයෝගයෙන් දත්ත කළමනාකරණ ඒකකය ලැයිස්තුව සකස් කිරීමේ ක්‍රියාවලිය සිදු කළේය.

4.41. ලැයිස්තුවේ පහත තොරතුරු අඩංගු වේ: i) අතුරුදහන් වූ තැනැත්තන් පිළිබඳ කාර්යාලය විසින් පවරා ඇති යොමු අංකයක්; ii) අතුරුදහන් වූ තැනැත්තාගේ නම ඉංග්‍රීසි සහ සිංහල හෝ දෙමළ භාෂාවෙන්; (iii) එම පුද්ගලයා අතුරුදහන් වූ හෝ අතුරුදහන් වූ දිනය; (iv) අතුරුදහන් වූ තැනැත්තා අවසන් වරට පදිංචි වී සිටි දිස්ත්‍රික්කය. අතුරුදහන් වූ දිනය සහ ඇය/ඔහු අතුරුදහන් වූ දිස්ත්‍රික්කය සම්බන්ධ තොරතුරු අපැහැදිලි වන විට, එය පිළිබිඹු වන්නේ "“N/A” යන්නෙනි. පැමිණිලි කරුවා පදිංචි දිස්ත්‍රික්කය මත පදනම්ව මෙම ලැයිස්තුව වර්ගීකරණය කර ඇති අතර රහස්‍යභාවය සහ ආරක්ෂාව සහතික කිරීම සඳහා පැමිණිලි කරුගේ විස්තර බැහැර කරන ලදි.

4.42. ක්‍රියාන්විතයේදී අතුරුදහන් වූ බවට ප්‍රකාශයට පත් කරන ලද සන්නද්ධ හමුදාවන් සඳහා කැප වූ ලැයිස්තුවේ පහත සඳහන් තොරතුරු ඇතුළත් වේ: i) අතුරුදහන් වූ තැනැත්තන් පිළිබඳ කාර්යාලය විසින් පවරා ඇති යොමු අංකය; ii) අතුරුදහන් වූ තැනැත්තාගේ නම ඉංග්‍රීසියෙන්; (iii) එම පුද්ගලයා අතුරුදහන් වූ දිනය; (iv) ත්‍රිවිධ හමුදාව විසින් පිරිස් සඳහා පවරා ඇති සේවා අංකය; v) අතුරුදහන් වූ තැනැත්තාගේ තරාතිරම; vi) පුද්ගලයා අතුරුදහන් වූ ස්ථානය සහ vii) හමුදා සාමාජිකයින් සම්බන්ධයෙන් නම්, අතුරුදහන් වූ තැනැත්තාගේ රෙජිමේන්තුව.

4.43. අතුරුදහන් වූ තැනැත්තන් පිළිබඳ කාර්යාලය වෙත තොරතුරු හෝ පැමිණිල්ල සිංහලෙන් සහ දෙමළෙන් ලබා දීමෙදී අතුරුදහන් වූ තැනැත්තාගේ නම ලබා දුන් ආකාරයට වාර්තා කර ඇත. එවැනි අවස්ථාවන්හිදී, ඒකීය බව රැකීම සඳහා හා ලැයිස්තුව තුළ සෙවීමට හැකි වන අයුරින් ප්‍රමිතිගත ඉංග්‍රීසි අක්ෂර වින්‍යාසය භාවිතයෙන් නම සටහන් කර ඇත. අතුරුදහන් වූ තැනැත්තන් පිළිබඳ කාර්යාලයට ඉංග්‍රීසියෙන් තොරතුරු ලබා දුන්නේ නම් ඒ ආකාරයටම එය වාර්තාගත කර ඇත.

4.44. මෙම ලැයිස්තුව ප්‍රකාශයට පත් කිරීම අතුරුදන් වූවන්ගේ දත්ත සම්බන්ධ කිරීමේ අඛණ්ඩ ක්‍රියාවලියක කොටසක් වන අතර, අතුරුදහන් වූ තැනැත්තන් පිළිබඳ කාර්යාලයේ වගකීම අනුව විශ්වීර්ණ නිල වාර්තාවක් සංවර්ධනය කිරීමට ඉඩ සලසනු ඇත. 2020 නොවැම්බර් මාසයේදී, ලැයිස්තුව බැලීම පිණිස අතුරුදහන් වූවන්ගේ පවුලේ සාමාජිකයින්ට සහ මහජනයාට අතුරුදහන් වූ තැනැත්තන් පිළිබඳ කාර්යාලයේ කොළඹ ප්‍රධාන කාර්යාලයට සහ මඩකලපුව, යාපනය, මන්නාරම සහ මාතර ප්‍රාදේශීය කාර්යාලවලට ඇරයුම් කරන ලදී. 2020 දෙසැම්බර් 10 දින අතුරුදහන් වූ තැනැත්තන් පිළිබඳ කාර්යාලයේ වෙබ් අඩවියේ ලැයිස්තුව පළ කරන ලදී[44].

5. විනිදිතයින් සහ සාක්ෂිකරුවන් ආරක්ෂා කිරීම

5.1. විනිදිකයින් සහ සාක්ෂිකරුවන්ගේ ආරක්ෂාව සඳහා පද්ධතියක් සංවර්ධනය කිරීමට සහ බලාත්මක කිරීමට අතුරුදහන් වූ තැනත්තන් පිළිබඳ කාර්යාලයට වගකීමක් පැවරී ඇත.[45] ආරක්ෂණ ඒකකයට, විනිදිකයින්, සාක්ෂිකරුවන් සහ අතුරුදහන් වූවන්ගේ පවුල්, අතුරුදහන් වූ තැනත්තන් පිළිබඳ කාර්යාලය හා සම්බන්ධ වන්නන්; අතුරුදහන් වූ තැනත්තන් පිළිබඳ කාර්යාලයේ කාර්ය මණ්ඩලය සහ

[44] අතුරුදහන් වූ තැනැත්තන් පිළිබඳ කාර්යාලය, "අතුරුදහන් වූ තැනැත්තන් පිළිබඳ කාර්යාලයේ ප්‍රකාශන" http://www.ompsrilanka.org/omp-documents/omp-publications 2020 දෙසැම්බර් 12 දින පිවිසිණි.

[45] අතුරුදහන් වූ තැනැත්තන් පිළිබඳ කාර්යාල පනත, 13 (1) (ඇ),

එහි පරිශ්‍රයේ ගැටළු, අවශ්‍යතාවන් සම්බන්ධව කටයුතු කිරීමේ සහ ඔවුන්ගේ අයිතීන් ආරක්ෂා කිරීමේ වගකීම පැවරී ඇත.

5.2. කොවිඩ් 19 වසංගතයට ප්‍රතිචාර වශයෙන් අතුරුදහන් වූ තැනැත්තන් පිළිබඳ කාර්යාලයේ කාර්ය මණ්ඩලය සහ පරිශ්‍රයන් ආරක්ෂා කිරීමට ආරක්ෂක ඒකකය කටයුතු කළේ ය. මෙම ප්‍රයත්නයන් සම්බන්ධීකරණය හා අධීක්ෂණය කිරීම සඳහා ප්‍රධාන සම්බන්ධතා පුද්ගලයා ලෙස ආරක්ෂක ප්‍රධානියා පත් කරන ලදී.

5.3. සෞඛ්‍ය අමාත්‍යාංශ මාර්ගෝපදේශයන්ට අනුකූලව සහ ලෝක සෞඛ්‍ය සංවිධානයේ ප්‍රමිතීන්ට අනුකූලව සෞඛ්‍ය හා ආරක්ෂිත ගැටලු පිළිබඳව අවධානය යොමු කිරීමට අතුරුදහන් වූ තැනැත්තන් පිළිබඳ කාර්යාලයට හැකි වන පරිදි ආරක්ෂක ඒකකය සූදානම් වීම සහ ප්‍රතිචාර දැක්වීම සඳහා කොවිඩ් 19 මෙහෙයුම් සැලසුම් මාර්ගෝපදේශ සකස් කළේය. කාර්ය මණ්ඩලයේ ශරීර උෂ්ණත්වය නිරන්තරව පරීක්ෂා කිරීම, පරිශ්‍රය විෂබීජහරණය කිරීම, නිවසේ සිට වැඩ කිරීම සම්බන්ධව කාර්ය මණ්ඩලය සමග සම්බන්ධීකරණය කිරීම සහ කොවිඩ් 19 ඇති බවට සොයාගත් පුද්ගලයන්ට නිරාවරණය වූ කාර්ය මණ්ඩලය සම්බන්ධව පසුවිපරම් කිරීම යනාදී ක්‍රියාමාර්ගයන් ගණනාවක් ඉටු කරන ලදී. අතුරුදහන් වූ තැනැත්තන් පිළිබඳ කාර්යාලය, මහජන සෞඛ්‍ය පරීක්ෂකවරුන් සහ සෞඛ්‍ය අමාත්‍යාංශයේ නිලධාරී සමග සම්බන්ධ වී කලට වේලාවට තොරතුරු ලබාගැනීමටද කටයුතු කළේ ය.

5.4. අතුරුදහන් වූ තැනැත්තන් පිළිබඳ කාර්යාලයේ අධ්‍යක්ෂ මණ්ඩලය විසින් ඒකකය සඳහා ආරක්ෂණ උපාය මාර්ගයක් අනුමත කරන ලද අතර එමගින් ඒකකයේ අරමුණු, බාහිර ආයතන සමග කටයුතු කිරීමේ විෂය පථය සහ ඒකකය ක්‍රියාත්මක කිරීමට ගත යුතු ක්‍රියා මාර්ග යනාදිය පිළිබඳව අවධානය යොමු කරන ලදී.

5.5. අතුරුදහන් වූවන්ගේ පවුල්වලට, නීතිඥයින් සහ අතුරුදහන් වූ තැනැත්තන් පිළිබඳ කාර්යාලය සමග සෘජුව කටයුතු කරන පුද්ගලයන් සහ සංවිධානවලට එරෙහිව සිදු කෙරෙන ප්‍රහාරයන් සම්බන්ධ වාර්තාවන් අතුරුදහන් වූ තැනැත්තන් පිළිබඳ කාර්යාලයට ලැබිණි. මෙම ආරක්ෂක ගැටළුවලට ශාරීරික සහ වාචික ප්‍රහාර, සමාජ මාධ්‍ය තුළින් සිදුවන ප්‍රහාර, ආවෙක්ෂණය සහ හිංසනය යනාදිය මෙයට ඇතුළත් විය.

5.6. නිරන්තරව ආරක්ෂාව පිළිබඳව ගැටළු සහිත පුද්ගලයන්ගේ ආරක්ෂාව සහතික කිරීම සඳහා අතුරුදහන් වූ තැනැත්තන් පිළිබඳ කාර්යාලය මැදිහත් විය.

6. ආයතනික සංවර්ධනය

6.1 අතුරුදහන් වූ තැනැත්තන් පිළිබඳ කාර්යාලය, තම කොළඹ ප්‍රධාන කාර්යාලය මෙන්ම මාතර, මන්නාරම, යාපනය සහ මඩකලපුව ප්‍රාදේශීය කාර්යාලවල කටයුතු සම්පූර්ණ මට්ටමෙන් අඛණ්ඩව පවත්වා ගැනීමට කැප වීමෙන් කටයුතු කළේ ය. ප්‍රාදේශීය කාර්යාල පිහිටුවීමත් සමග බලපෑමලත් දිස්ත්‍රික්කවල සිටින පවුල්වලට ප්‍රවේශ වීමට හැකියාව ලැබී තිබේ. පවුල් සමග කටයුතු කිරීමේදී සංවේදීව සහ ඔවුන්ගේ ගරුත්වය රැකෙන පරිදි කටයුතු කිරීමට අතුරුදහන් වූ තැනැත්තන් පිළිබඳ කාර්යාලය නිරන්තරව කටයුතු කරයි.

6.2 ප්‍රධාන තනතුරුවලට පත් වූ සේවක මණ්ඩලය රඳවා තබාගැනීම සැලකිය යුතු අභියෝගයක් වූ අතර විවිධ රීති සහ රෙගුලාසි නිසා අයවැය යටතේ වෙන් කරන ලද අරමුදල් සම්පූර්ණයෙන් ප්‍රයෝජනයට ගැනීමේ හැකියාව අඩු වී තිබිණි. කොවිඩ් 19 වසංගතය නිසා ද අතුරුදහන් වූ තැනැත්තන් පිළිබඳ කාර්යාලයේ ආයතනික සංවර්ධන කටයුතුවලට සීමාවන් පැනවිණි.

6.3 අතුරුදහන් වූ තැනැත්තන් පිළිබඳ කාර්යාලයේ ස්ථාපිත කිරීම සහ සංවර්ධනය සඳහා සභාපති සහ කොමසාරිස්වරු තීරණාත්මක කාර්යභාරයක් ඉටු කළ අතර ප්‍රධාන කාර්යයන් ඉටු කිරීම සඳහා එකවර විවිධ මට්ටම්වල නිරත වූහ. අතුරුදහන් වූ තැනැත්තන් පිළිබඳ කාර්යාලයේ උපාය මාර්ගික සංවර්ධනය සම්බන්ධව සාකච්ඡා කිරීමට අධ්‍යක්ෂ මණ්ඩලය නිරන්තරව රැස්වූ අතර වසර තුළ පැවැත්වූ රැස්වීම් ගණන 26 ක් විය. කොමසාරිස්වරුන් අතුරුදහන් වූ තැනැත්තන් පිළිබඳ කාර්යාලයේ තනි තනිව අධීක්ෂණය කළ අතර ප්‍රධානීන් පත් නොකළ ඒකකවල කටයුතු හෝ ස්ථාපනය නොකළ ඒකකවල කටයුතු සඳහා කාර්ය මණ්ඩලය සමග එක්ව වැඩ කළහ. එමෙන්ම පවුල්, සිවිල් සමාජය සහ අනෙකුත් රාජ්‍ය නිලධාරීන් සඳහා වන වැඩසටහන්, විමසීම්, ස්ථාන නැරඹීම සහ දැනුවත් කිරීමේ වැඩසටහන් පැවැත්වීමට කොමසාරිස්වරුන් සහභාගී වී ඇත.

භෞතික පරිශ්‍රය ස්ථාපිත කිරීම

6.4 හිටපු කථානායක ගරු කරු ජයසූරිය මහතා විසින් වසර දෙකක කාලයක් සඳහා කොළඹ 7, ශ්‍රීමත් මාකස් ප්‍රනාන්දු මාවතේ අංක 32 දරණ "ශ්‍රාවස්ති සංකීර්ණය" පවරන ලද අතර් එය 2020 ඔක්තෝම්බර් මාසයේදී අවසන් වීමට නියමිතව තිබිණි.

6.5 කෙසේ වෙතත්, 2019 සිට අතුරුදහන් වූ තැනැත්තන් පිළිබඳ කාර්යාල වෙත තම ස්ථානය විකල්ප පරිශ්‍රයකට මාරු කරන ලෙස ඉල්ලීම් ගණනාවක් ලැබී තිබුණි. 2019 නොවැම්බර් මාසයේදී අතුරුදහන් වූ තැනැත්තන් පිළිබඳ කාර්යාලයට ශ්‍රාවස්ති සංකීර්ණය හැර යන ලෙසටත් විකල්ප ස්ථාන ගණනාවකින් එකකට මාරු වෙන ලෙසටත් ඉල්ලීමක් ලැබිණි. අධිකරණ, මානව හිමිකම් සහ නීති ප්‍රතිසංස්කරණ අමාත්‍යාංශය විසින් සිදු කරන ලද පිරිනැමුමකට පසුව අතුරුදහන් වූ තැනැත්තන් පිළිබඳ කාර්යාලය 2020 ජූනි 15 දින කොළඹ 03, ගාලු පාර, 03 වන මහලේ අංක 408 ගොඩනැගිල්ල වෙත මාරු විය. එය භානිපූර්ණ කාර්යාලය සමග ගොඩනැගිල්ල බෙදා ගන්නා අතර මාසික කුලිය වන රු.මි.1.8 ට මෙන්ම උපයෝගිතා බිල් සඳහා ද දායකත්වය සපයයි.

කාර්ය මණ්ඩලය බඳවා ගැනීම

6.6 අතුරුදහන් වූ තැනැත්තන් පිළිබඳ කාර්යාලය පිහිටුවීමෙන් පසු, එහි තනතුරු පිරවීම සඳහා අවශ්‍ය පළපුරුද්දක් ඇති සුදුසුකම් ලත් සේවකයින් බඳවා ගැනීම සඳහා සැලකිය යුතු කාලයක්, බලශක්ති හා සම්පත් වැය කර ඇත.

6.7 අයදුම්පත් සමාලෝචනය කිරීමේදී සහ අයදුම්කරුවන් සම්මුඛ පරීක්ෂණයේදී, අවශ්‍ය නිපුණතා සහ පළපුරුද්ද ඇති පුද්ගලයින් ආකර්ෂණය කර ගැනීම සඳහා තනතුරු ගණනාවක් නැවත සැලසුම් කළ යුතු බව අතුරුදහන් වූ තැනැත්තන් පිළිබඳ කාර්යාලය විසින් තීරණය කරන ලදී. අතුරුදහන් වූ තැනැත්තන් පිළිබඳ කාර්යාලය පහත තනතුරු ප්‍රතිශෝධනය කළේ ය: මානව සම්පත් හා පරිපාලන ප්‍රධානී (HM 1-1), මූල්‍ය හා ප්‍රසම්පාදන ප්‍රධානී(HM 1-1), මණ්ඩලයේ ලේකම්/ජ්‍යෙෂ්ඨ නීති නිලධාරී (MM 1-1), ජ්‍යෙෂ්ඨ නීති නිලධාරී (MM 1-1), බඳවා ගැනීමේ යෝජනා ක්‍රම සඳහා අනුමැතිය සඳහා අධිකරණ, මානව හිමිකම් හා නීති ප්‍රතිසංස්කරණ අමාත්‍යාංශය හරහා කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුවට යවන ලදී.

6.8 2019 දී පැවති සම්මුඛ පරීක්ෂණ ක්‍රියාවලියෙන් පසුව 2020 දී අතුරුදහන් වූ තැනැත්තන් පිළිබඳ කාර්යාලයට එක් පුරප්පාඩුවක් ස්ථිර පදනමක් මත පිරවීමට හැකි විය. අතුරුදහන් වූ තැනැත්තන් පිළිබඳ කාර්යාලයේ කාර්ය මණ්ඩලය බඳවා ගැනීමට ගත් උත්සාහයට ප්‍රධාන වශයෙන් මහ මැතිවරණය හා ඒ වන විටත් රට තුළ පැවති කොවිඩ්- 19 වසංගතය බලපෑම් කළේ ය.

6.9 2020 වසර පුරාවටම, වෙනත් රැකියා සඳහා කාර්ය මණ්ඩල සාමාජිකයින් 15 දෙනෙකු අතුරුදහන් වූ තැනැත්තන් පිළිබඳ කාර්යාලයෙන් ඉවත් වූ අතර, කොන්ත්‍රාත් පදනම මත සිටි කාර්ය මණ්ඩල සාමාජිකයින් 01 දෙනෙකු සිය සේවා කාලය අවසන් කළේ ය. වෙනත් කොන්ත්‍රාත් සේවකයින් 12 දෙනෙකුට රැකියාව අවසන් කිරීමේ හේතුව නිසා සංවිධානය හැර යාමට සිදු විය. මීට අමතරව, පැවරුම් පදනමින් සේවයේ යෙදී සිටි එක් සාමාජිකයෙකු 2020 දී තම සේවය අවසන් කළේ ය.

6.10 2018 දී අතුරුදහන් වූ තැනැත්තන් පිළිබඳ කාර්යාලය පිහිටුවීමෙන් පසු පළමු සභාපතිවරයා ලෙස පත් කරන ලද සාලිය පීරිස් මහතා 2020 සැප්තැම්බර් මස 30 දින තම තනතුරෙන් ඉල්ලා අස් වුයේ ය.

6.11 2020 නොවැම්බර් 30 දින සිට ක්‍රියාත්මක වන පරිදි අතිගරු ජනාධිපතිතුමා විසින් ගරු විශ්‍රාමලත් විනිසුරු උපාලි අබේරත්න මහතා අතුරුදහන් වූ තැනැත්තන් පිළිබඳ කාර්යාලයේ සභාපති ලෙස පත් කරන ලදී.

ප්‍රාදේශීය කාර්යාල

6.12 අතුරුදහන් වූ තැනැත්තන් පිළිබඳ කාර්යාලයට අවශ්‍ය වන පරිදි ප්‍රධාන කාර්යාලය කොළඹ සහ ප්‍රාදේශීය කාර්යාලවල පිහිටුවීමට බලය ඇත.[46] CTF හි නිර්දේශ අනුගමනය කරමින්, අතුරුදහන් වූවන්ගේ පවුල් සමඟ තමන් විසින්ම කරන ලද මහජන අදහස් විමසීම් සහ අතුරුදහන් වූවන්ගේ සිදුවීම්වල භූගෝලීය රටාවන් අනුව ප්‍රාදේශීය කාර්යාල හතරක් සහ උප කලාපීය කාර්යාල අටක් ස්ථාපිත කළ යුතු බව අතුරුදහන් වූ තැනැත්තන් පිළිබඳ කාර්යාලය තීරණය කළේය.

6.13 අතුරුදහන් වූ තැනැත්තන් පිළිබඳ කාර්යාලයේ ප්‍රාදේශීය කාර්යාල අතුරු වාර්තා සඳහා සහාය වෙමින් පවුල් වලින් පැමිණිලි ලබා ගත් අතර අදාළ රාජ්‍ය හා රාජ්‍ය නොවන සංවිධාන සමඟ සාකච්ඡා ද පැවැත්වූහ.

6.14 ප්‍රාදේශීය කාර්යාල වෙත පවුල් පැමිණීම් ගණන පහත දක්වා ඇත.

ප්‍රාදේශීය කාර්යාලය	2020 වසරේ පැමිණි අය ගණන
මාතර	485
මන්නාරම	654
යාපනය	852
මඩකලපුව	නොලැබිණි
එකතුව	1,991

6.15 ප්‍රාදේශීය කාර්යාලවල පැවැත්වූ අතුරු වාර්තා විමසුම් ගණන පහත දක්වා ඇත..

ප්‍රාදේශීය කාර්යාලය	නිකුත් කළ අතුරු වාර්තා ගණන	මණ්ඩල අනුමැතිය අපේක්ෂිත අතුරු වාර්තා ගණන	විමසුම් සිදු කළ අතුරු වාර්තා ගණන
මාතර	1	5	7
මන්නාරම	42	21	68
යාපනය	24	15	59
මඩකලපුව	-	11	13
එකතුව	67	52	147

[46] අතුරුදහන් වූ තැනැත්තන් පිළිබඳ කාර්යාල පනත, 3 (3) වගන්තිය.

ක්‍රියා පටිපාටි සහ රීති සංවර්ධනය කිරීම

6.16 අතුරුදහන් වූ තැනැත්තන් පිළිබඳ කාර්යාලයට එහි ඵලදායී ක්‍රියාකාරිත්වය සඳහා අවශ්‍ය නීති රීති හා ක්‍රියා පටිපාටි සංවර්ධනය කිරීමට බලයක් ඇත.[47]
2020 වසර තුළ, අතුරුදහන් වූ තැනැත්තන් පිළිබඳ කාර්යාලය අතුරු වාර්තා නිකුත් කිරීම, දත්ත සැකසීම, කොවිඩ් 19 සහ අධ්‍යක්ෂ මණ්ඩලයේ පැවැත්ම සම්බන්ධව රීති, මාර්ගෝපදේශ සහ ක්‍රියාපටිපාටීන් සැකසීම අවසන් කළේ ය.

6.17 සෞඛ්‍ය අමාත්‍යාංශයේ මාර්ගෝපදේශ අනුව සහ තම කාර්ය මණ්ඩලයේ සෞඛ්‍ය හා සුවතාව වෙනුවෙන් අතුරුදහන් වූ තැනැත්තන් පිළිබඳ කාර්යාලය විසින් කොවිඩ් 19 ක්‍රියාමාර්ගයන් සකසන ලදී.

6.18 2019 වසරේදී අතුරු වාර්තා නිකුත් කිරීම සඳහා ප්‍රතිපත්ති සහ විමසුම් ක්‍රියාපටිපාටි ඇතුළු ක්‍රියාපටිපාටීන් සංවර්ධනය කිරීමට අමතරව අතුරුදහන් වූ තැනැත්තන් පිළිබඳ කාර්යාලය, කාර්ය මණ්ඩලය අඩුවීම සහ කොවිඩ් 19 වසංගතය විසින් ඇති ව තිබෙන සීමාවන් සලකා බලමින් 2020 වසරේදී විමසුම් ක්‍රියා පටිපාටියට යාවත්කාලීනයක් එක් කළේ ය. අතුරු වාර්තා විමසීම් පැවැත්වීම සම්බන්ධයෙන් ප්‍රාදේශීය කාර්යාල සඳහා හා පරීක්ෂණ පැවැත්වූ නිලධාරීන්ගෙන් විමසීම සඳහා වැඩිදුර ක්‍රියා පටිපාටි සකස් කරන ලදි; අතුරු වාර්තා සඳහා අතථ්‍ය සම්මුඛ සාකච්ඡා සහ විමසීම් පැවැත්වීම සඳහා මාර්ගෝපදේශ; විමසීම් කරන විට විමසීමේ නිලධාරීන් සහ ප්‍රාදේශීය කාර්යාල කාර්ය මණ්ඩලය සඳහා නිශ්චිත කොවිඩ් 19 මාර්ගෝපදේශන; සහ අතුරු වාර්තා බෙදා හැරීම යනාදී කටයුතු සිදු කරන ලදී

6.19 අතුරුදහන් වූ තැනැත්තන් පිළිබඳ කාර්යාලය, දත්ත සැකසීමේදී අනුකූලතාව සහ නිරවද්‍යතාවය සහතික කිරීම සඳහා, අතුරුදහන් වූ පුද්ගලයන් වර්ගීකරණය, තාවකාලික ලැයිස්තුව තහවුරු කිරීමේ ක්‍රියාවලිය පිළිබඳ ලේඛන, අතුරුදහන් වූ තැනැත්තන් පිළිබඳ කාර්යාලයේ විවිධ ඒකක මඟින් අතුරුදහන් වූවන්ගේ දත්ත ලිපිගොනු සම්බන්ධයෙන් ගත් නිවැරදි පියවර මිනිත්තු නඩත්තු කිරීම; දත්ත ගොනු වසා දැමීම පිළිබඳව සඳහන් අතුරුදහන් වූ තැනැත්තන් පිළිබඳ කාර්යාල පනතේ 27 වන වගන්තිය යටතේ අතුරුදහන් වූ පුද්ගලයින් වර්ගීකරණය කිරීම සඳහා වූ මාර්ගෝපදේශ සකසන ලදී.

6.20 අතුරුදහන් වූ තැනැත්තන් පිළිබඳ කාර්යාලය කොමසාරිස්වරුන් සඳහා රහස්‍යතා ගිවිසුමක් සහ භාවිත ප්‍රතිපත්ති මාලාවක් සම්පාදනය කරන ලදී.

පවුල් කෙරෙහි මනෝ සමාජීය ප්‍රතිචාර දැක්වීම සහ සංවේදීතාව සහතික කිරීම

6.21 2019 දී අධ්‍යක්ෂ මණ්ඩලය විසින් සංවර්ධනය කරන ලද මනෝසමාජයීය උපාය මාර්ගය අනුව අතුරුදහන් වූ තැනැත්තන් පිළිබඳ කාර්යාලය තම කාර්යභාරය ඉටු කළේ ය. අතුරුදහන් වූ තැනැත්තන් පිළිබඳ කාර්යාලයේ ප්‍රධාන කාර්යලය හෝ ප්‍රාදේශීය කාර්යාලය වෙත පැමිණි පසු පවුල්වලට පළමුව මුණ ගැසෙන්නේ පවුල් සහය නිලධාරීන් වන අතර ඔවුන් පවුලේ සාමාජිකයින් සමග කටයුතු කරමින් ඔවුන්ගේ පැමිණිලි සටහන් කරගනී. ඉන්පසු තොරතුරු ලබා දී පසු විපරම් කටයුතු සඳහා අනෙක් ඒකක සහ කාර්ය මණ්ඩලය සමග සාකච්ඡා කරයි.

[47] අතුරුදහන් වූ තැනැත්තන් පිළිබඳ කාර්යාල පනත, 11 (ආ): 26 වගන්තිය.

6.22 අතුරුදහන් වූ තැනැත්තන් පිළිබඳ කාර්යාලය වසර පුරාම වින්දිකයින් සහ පවුල් වෙතින් අදහස් විමසූ අතර කොවිඩ් 19 වසංගතය හේතුවෙන් අනුගමනය කළ සෞඛ්‍ය සීමාවන් එයට දැඩි ලෙස බලපෑම් කළේ ය. කාර්යාල පරිශ්‍රය වෙනස් වීමද පවුල් සමග සෘජු සන්නිවේදනයට බාධා කළේ ය.

ධාරිතා වර්ධනය හා දැනුම් බෙදාගැනීම

6.23 2020 වසර තුළ අතුරුදහන් වූ තැනැත්තන් පිළිබඳ කාර්යාලය තම කාර්යාලයට සීමිත පුහුණු වැඩසටහන් ප්‍රමාණයක් පැවැත්වී ය. 2020 වසරේදී අතුරුදහන් වූ තැනැත්තන් පිළිබඳ කාර්යාලය කිසිදු බාහිර පුහුණුව නියැලුණේ නැත. කොවිඩ් 19 ට අදාළ සෞඛ්‍ය මාර්ගෝපදේශ සහ රට වසා දැමීම් නිසා පුහුණු වැඩසටහන් පැවැත්වීමට සහ ඒවාට සහභාගි වීමට තිබූ හැකියාව අවම විය.

6.24 2020 වසර තුළ අතුරුදහන් වූ තැනැත්තන් පිළිබඳ කාර්යාලයේ කාර්ය මණ්ඩලය සඳහා පහත පුහුණු වැඩසටහන් පවත්වන ලදී

දිනය	විෂය	සහභාගී වූ අය ගණන
මාර්තු 4- 5	පහත මානෘකා ඔස්සේ යාපනයේදී සියලුම ප්‍රාදේශීය සම්බන්ධීකාරකවරුන්ට පුහුණු වැඩසටහනක් පැවැත්වී ය. (i) අතුරුදහන් වූ තැනැත්තන් පිළිබඳ කාර්යාල විධිනියෝග සහ කාර්යයන්; (ii) රහස්‍යභාවය සහ අතුරුදහන් වූ තැනැත්තන් පිළිබඳ කාර්යාලයේ නෛතික බැඳීම්; (iii) අතුරු වාර්තා සහ සම්මුහුර්ත නිකුත් කිරීමේ ක්‍රියාවලිය; (iv) මරණ සහතික ලබාගැනීම සහ අතුරුදහන් වූවන් සොයාගැනීම ඇතුළු පවුල් විසින් මතු කරන පොදු නෛතික ප්‍රශ්න	4
ජූනි 2-3	අතුරුදහන් වූ තැනැත්තන් පිළිබඳ කාර්යාලයේ විධිනියෝගය, තාවකාලික දත්ත පදනම සහ ආරක්ෂණ ගැටළු සම්බන්ධව කොමසාරිස් රහීම් සහ දත්ත පදනම් නිලධාරියෙකු විසින් මඩකලපුව ප්‍රාදේශීය කාර්යාලයේ කාර්ය මණ්ඩලයට පුහුණුව ලබා දෙන ලදී	5
ජූනි 11	අතුරුදහන් වූ තැනැත්තන් පිළිබඳ කාර්යාලයේ විධිනියෝගය, තාවකාලික දත්ත පදනම සහ ආරක්ෂණ ගැටළු සම්බන්ධව කොමසාරිස් රහීම්, කොමසාරිස් චෙන්දන් සහ දත්ත පදනම් නිලධාරියෙකු විසින් යාපනය සහ මන්නාරම ප්‍රාදේශීය කාර්යාලයේ කාර්ය මණ්ඩලයට පුහුණුව ලබා දෙන ලදී	8
ජූලි 11	ජ්‍යෙෂ්ඨ නෛතික උපදේශක විසින් අතුරු වාර්තා නිකුත් කිරීමේ ක්‍රියාවලිය තුළ විමසුම් නිලධාරීන්ගේ ක්‍රියාකාරිත්වය පිළිබඳව අතුරුදහන් වූ තැනැත්තන් පිළිබඳ කාර්යාලයේ නීතිඥයින්ව දැනුවත් කළේ ය.	3
සැප්තැම්බර් 12-13	ජ්‍යෙෂ්ඨ නීති උපදේශකයෙකු සහ අධිකරණ වෛද්‍ය විශේෂඥ කොමසාරිස් රහීම්, අතුරුදහන් වූ තැනැත්තන් පිළිබඳ කාර්යාල වෙනුවෙන් පෙනී සිටින අතුරුදහන් වූ තැනැත්තන් පිළිබඳ කාර්යාලයේ කාර්ය මණ්ඩලය සහ නීතිඥයින් හඳුනා ගැනීම පිළිබඳ පුහුණුවක් පැවැත්වීය.	5

තොරතුරු දැනගැනීමේ අයිතිය

6.25 2016 අංක 12 දරන තොරතුරු දැනගැනීමේ අයිතිය පනත යටතේ අතුරුදහන් වූ තැනැත්තන් පිළිබඳ කාර්යාලය සතු තොරතුරු වෙත පිවිසීම ලබා දිය යුතු ය. පහත වගුව මගින් 2019 සහ 2020 වසර තුළ අතුරුදහන් වූ තැනැත්තන් පිළිබඳ කාර්යාලය තොරතුරු දැනගැනීමේ අයිතිය ක්‍රියාත්මක කළ ආකාරය දක්වා ඇත.

අංකය	විෂය	දින ගණන
1	2019 සහ 2020 වසර තුළ කළ ඉල්ලීම් ගණන	8
2	සම්පූර්ණ තොරතුරු ලබාදෙනු ලැබූ ඉල්ලීම් ගණන	8
3	අර්ධ වශයෙන් තොරතුරු ලබාදෙනු ලැබූ ඉල්ලීම් ගණන	0
4	පනතේ 5 වන වගන්තිය අනුව ප්‍රතික්ෂේප කරන ලද ඉල්ලීම් ගණන	0
5	පනතේ 5 වන වගන්තියේ අඩංගු හේතු මත හැර ප්‍රතික්ෂේප කරන ලද තොරතුරු ඉල්ලීම් ගණන (උදා. තොරතුරු නොමැති වීම)	0
6	තොරතුරු ඉල්ලීම්වලට ප්‍රතිචාර දැක්වීමට ගන්නා ලද සාමාන්‍ය කාල සීමාව කොපමණ ද (වැඩ කරන දින ගණන)	දින 11
7	තැපෑලෙන් කෙතරම් තොරතුරු ඉල්ලීම් ගණනක් ලැබුණේ ද?	8
8	ඊමේල් මගින් කෙතරම් තොරතුරු ඉල්ලීම් ගණනක් ලැබුණේ ද?	0
9	තැපෑල හෝ ඊමේල් හැර වෙනත් ආකාරවලින් කෙතරම් තොරතුරු ඉල්ලීම් ගණනක් ලැබුණේ ද?	0

7 සන්නිවේදනය සහ ප්‍රජාව වෙත යොමුවීම

7.1 අතුරුදහන් වීම්වලට හේතු, සිදුවීම් සහ බලපෑම් පිළිබඳව මහජනතාව දැනුවත් කිරීම සහ ඔවුන්ගේ ඥාතීන්ගේ අවශ්‍යතා සපුරාලීම සඳහා මහජන සහයෝගය ඇති කිරීම අතුරුදහන් වූ තැනැත්තන් පිළිබඳ කාර්යාලයට පැවරී ඇති එක් වගකීමකි.[48] 2018 දී අතුරුදහන් වූ තැනැත්තන් පිළිබඳ කාර්යාලය පිහිටුවීමේ සිට, අතුරුදහන් වූ තැනැත්තන් පිළිබඳ කාර්යාලයේ විධිනියෝග සහ වැඩ කටයුතු පිළිබඳව දැනුවත් කිරීම, අතුරුදහන් වීමේ ප්‍රතිවිපාක පිළිබඳව දැනුවත් කිරීම; අතුරුදහන් වූවන් ඔවුන්ගේ පවුල්වල අයිතිවාසිකම් ආරක්ෂා කිරීම සඳහා රාජ්‍යයේ සහ සමාජයේ වගකීම; සහ අතුරුදහන් වූ තැනැත්තන් පිළිබඳ කාර්යාලය සම්බන්ධයෙන් ඇති වැරදි වැටහීම් වැලැක්වීම සඳහා සන්නිවේදන උපාය මාර්ගයක් සකස් කර ඇත; මේ සඳහා, මුද්‍රිත මාධ්‍ය හා ඩිජිටල් හා සන්නිවේදන වේදිකා තුළින් අතුරුදහන් වූවන්ගේ පවුල්, ප්‍රධාන පාර්ශ්වකරුවන් සහ සාමාන්‍ය ජනතාවට අතුරුදහන් වූ

[48] අතුරුදහන් වූ තැනැත්තන් පිළිබඳ කාර්යාල පනත, 13 (ඒ) වගන්තිය.

කැනැත්තන් පිළිබඳ කාර්යාලයේ වැඩ කටයුතු පිළිබඳව දැනගැනීමට සහ ඉගෙන ගැනීමට සලස්වා තිබේ. [49]

7.2 සන්නිවේදන සහ බාහිර සබඳතා ඒකකය මාධ්‍ය අධීක්ෂණය කරන අතර අධ්‍යක්ෂ මණ්ඩලයේ අධීක්ෂණය යටතේ සන්නිවේදන මාධ්‍ය සංවර්ධනය කරයි. ඒකක ප්‍රධානියාගේ තනතුර සඳහා අතුරුදහන් වූ කැනැත්තන් පිළිබඳ කාර්යාලය සම්මුඛ පරීක්ෂණ පැවැත්වීය. කෙසේ වෙතත්, ක්‍රියාකාරීත්වය සහිත හොඳම නිපුණතා හා පළපුරුද්ද හඳුනා ගැනීමට නොහැකි විය.

පොදු අවස්ථා

7.3 පවතින කොවිඩ් 19 වසංගත තත්ත්වය හේතුවෙන් අතුරුදහන් වූ කැනැත්තන් පිළිබඳ කාර්යාලයට පොදු වැඩසටහන් කිසිවක් පැවැත්වීය නොහැකි විය.

මාධ්‍ය සමග සම්බන්ධතා

7.4 පුවත්පත් නිවේදන, පුවත්පත් සාකච්ඡා, සම්මුඛ සාකච්ඡා, විවෘත සංස්කරණ සහ මාධ්‍ය සාමාජිකයින්ගේ තොරතුරු සඳහා වන ඉල්ලීම්වලට ප්‍රතිචාර දැක්වීම මඟින් මාධ්‍ය සමඟ සම්බන්ධ වීමට අතුරුදහන් වූ කැනැත්තන් පිළිබඳ කාර්යාලය උත්සාහ කරයි. මාධ්‍ය කටයුතුවලට සම්බන්ධ වෙමින් අතුරුදහන් වූ කැනැත්තන් පිළිබඳ කාර්යාලය සිය වැඩ කටයුතු පිළිබඳව මහජනයා දැනුවත් කිරීමටත් ඒ පිළිබඳ වැරදි වැටහීම් දුරු කිරීමටත් උත්සාහ කරයි

7.5 2020 වසරේදී අතුරුදහන් වූ කැනැත්තන් පිළිබඳ කාර්යාලය පහත මාධ්‍ය නිවේදන නිකුත් කළේය.

දිනය	මාතෘකාව
ජනවාරි 15	"OMP පනත සමාලෝචනය කිරීම"[50]
පෙබරවාරි 2	"අතුරුදහන් වූ පුද්ගලයන්ගේ තාවකාලික ලැයිස්තුව සනාථ කිරීම"[51]
පෙබරවාරි 10	"අතුරුදහන් වූ කැනැත්තන් පිළිබඳ කාර්යාලය අතුරු වාර්තා නිකුත් කිරීම අරඹයි"[52]
මාර්තු 03	"අතුරුදහන් වූ කැනැත්තන් පිළිබඳ කාර්යාලය පිහිටුවීමේ දෙවන සංවත්සරය"[53]
අප්‍රේල් 07	"අතිගරු ජනාධිපතිතුමා, අගමැතිතුමා සහ කොවිඩ් 19 සහන පිළිබඳ ජනාධිපති කාර්ය සාධක බලකායේ සභාපති වෙත ලිපි"[54]
නොවැම්බර් 26	"පැමිණිලි ලැයිස්තුව සහ අතුරුදහන් වූ පුද්ගලයන් පිළිබඳ තොරතුරු"[55]

[49] ඊමේල්: ompsrilanka@gmail.com; Twitter: https://twitter.com/ompsrilanka; Facebook: https://www.facebook.com/ompsrilanka

[50] අතුරුදහන් වූ කැනැත්තන් පිළිබඳ කාර්යාලයේ, "මාධ්‍ය නිවේදනය" (2020 ජනවාරි 15). <https://twitter.com/ompsrilanka/status/1217345382071574528?s=20> 2020 දෙසැම්බර් 30 දින පිවිසුණි

[51] අතුරුදහන් වූ කැනැත්තන් පිළිබඳ කාර්යාලය "අතුරුදහන් වූ පුද්ගලයන්ගේ තාවකාලික ලැයිස්තුව සනාථ කිරීම" (2020 සැප්තැම්බර් 2) < https://twitter.com/ompsrilanka/status/1226365980651196416?s=20 2020 දෙසැම්බර් 30

[52] අතුරුදහන් වූ කැනැත්තන් පිළිබඳ කාර්යාලය "අතුරුදහන් වූ කැනැත්තන් පිළිබඳ කාර්යාලය අතුරු වාර්තා නිකුත් කිරීම අරඹයි" (2020 පෙබරවාරි 10) < https://twitter.com/ompsrilanka/status/1226752435957436417?s=20> 2020 දෙසැම්බර් 30

[53] අතුරුදහන් වූ කැනැත්තන් පිළිබඳ කාර්යාලය "අතුරුදහන් වූ කැනැත්තන් පිළිබඳ කාර්යාලය පිහිටුවීමේ දෙවන සංවත්සරය (2020 මාර්තු 3) < https://twitter.com/ompsrilanka/status/1234754919489572870?s=20> 2020 දෙසැම්බර් 30.

[54] <https://twitter.com/ompsrilanka/status/1247805580758011907/photo/1> 2020 අප්‍රේල් 07

[55] <https://twitter.com/ompsrilanka/status/1331910889310621696> 2020 නොවැම්බර් 26.

7.6 2020 වසරේදී මණ්ඩලය සහ කාර්ය මණ්ඩලය පහත අවස්ථාවලදී අතුරුදහන් වූ තැනැත්තන් පිළිබඳ කාර්යාලය නියෝජනය කළේය:

දිනය	අවස්ථාව
සැප්තැම්බර් 23	බලහත්කාරයෙන් අතුරුදහන් වීමෙන් සියලු පුද්ගලයින් ආරක්ෂා කිරීම සඳහා වන එක්සත් ජාතීන්ගේ ජාත්‍යන්තර සම්මුතිය බලාත්මක වී වසර 10 ක් සැපිරීම සහ එක්සත් ජාතීන්ගේ WGEID පිහිටුවා වසර 40 ක් පිරීම නිමිත්තෙන් පැවැත්වූ බලහත්කාරී ලෙස අතුරුදහන් කරවූවන් සෙවීම සහ විමර්ශනය පිළිබඳ මාර්ගගත වැඩමුළුවකට කොමසාරිස් ආචාර්ය නිමල්කා ප්‍රනාන්දු සහභාගී වූවා ය.
දෙසැම්බර් 16	මානව හිමිකම් පිළිබඳ මහකොමසාරිස් කාර්යාලය විසින් සංවිධානය කරන ලද "උත්ප්‍රේරක බලය සහ හානිපූර්ණය" නම් මාර්ගගත සම්මන්ත්‍රණයේදී කොමසාරිස් මිරාක් රහීම් මහතා "වන්දි ගෙවීම හා සම්බන්ධ උහතෝකෝටිකය" යන මාතෘකා ඉදිරිපත් කළේය.

ඩිජිටල් මාධ්‍ය මත පැවැත්ම

7.7 ඩිජිටල් වේදිකා හරහා මහජනතාව සමග සම්බන්ධ වීම පිණිස අතුරුදහන් වූ තැනැත්තන් පිළිබඳ කාර්යාලය Twitter[56] සහ Facebook[57] සමාජ මාධ්‍ය ගිණුම් සැකසිය. 2020 දෙසැම්බර් 22 වන විට අතුරුදහන් වූ තැනැත්තන් පිළිබඳ කාර්යාලයේ ෆේස්බුක් හි අනුගාමිකයන් 5,149 ක් සහ ට්විටර් හි අනුගාමිකයන් 1,866 ක් සිටියහ.

7.8 අතුරුදහන් වූ තැනැත්තන් පිළිබඳ කාර්යාලයට තම වැඩකටයුතුවලට මහජනතාවට ප්‍රවේශ වීමට ඉඩ සැලසීම සඳහා 2020 නොවැම්බර් 19 වනදින එහි පළමු වෙබ් අඩවිය ඉංග්‍රීසි මාධ්‍යයෙන් දියත් කිරීමට හැකි විය. 2020 දෙසැම්බර් 22 දින වෙබ් අඩවියට 50 දෙනෙකු පැමිණ තිබිණි. 2021 ජනවාරි මාසයේදී වෙබ් අඩවිය සිංහල හා දෙමළ මාධ්‍යයෙන්ද දියත් කෙරිණි.

8 අනුස්මරණය සහ ස්මරණය

8.1 අතුරුදහන් වූවන්ගේ ඥාතීන්ගේ අවශ්‍යතා සපුරාලීමට මහජන සහයෝගය ඇති කිරීමට පියවර ගැනීම සහ අනුස්මරණය හා පිළිගැනීම පිළිබඳ නිර්දේශ ඉදිරිපත් කිරීමට අතුරුදහන් වූ තැනැත්තන් පිළිබඳ කාර්යාලයට බලය ඇත.[58] තම ආදරණීයයන් සැමරීම සඳහා පවුල්වල සහ ජනතාවට ඇති අයිතිය

[56] "අතුරුදහන් වූ තැනැත්තන් පිළිබඳ කාර්යාලයේ ට්විටර් ගිණුම" (2018 ජූනි 24) <https://twitter.com/ompsrilanka> (2020 දෙසැම්බර් 22 දින පිවිසුණි).

[57] "අතුරුදහන් වූ තැනැත්තන් පිළිබඳ කාර්යාලයේ Facebook ගිණුම" (2018 ඔක්තෝබර් 23) < https://www.facebook.com/ompsrilanka/> (2020 දෙසැම්බර් 22 දින පිවිසුණි).

[58] අතුරුදහන් වූ තැනැත්තන් පිළිබඳ කාර්යාල පනත, 13 (1) ,(j),(k)(ii).වගන්තිය.

තහවුරු කිරීමට සහ අතුරුදහන් වූවන් සහ ඔවුන්ගේ පවුල් සඳහා රජය සහ සමාජය තුළ වැඩි පිළිගැනීමක් ලබා දීමට අතුරුදහන් වූ තැනැත්තන් පිළිබඳ කාර්යාලය උත්සාහ කරයි.

8.2 අතුරුදහන් වීම් සම්බන්ධයෙන් කටයුතු කරන සිවිල් සංවිධාන සාමාජිකයින්ගේ සහභාගීත්වයෙන් අතුරුදහන් වූ තැනැත්තන් පිළිබඳ කාර්යාලය අඛණ්ඩව තුන්වන වසරටත්, බලහත්කාරී ලෙස අතුරුදහන් කරන ලද විත්දිතයන්ගේ ජාත්‍යන්තර දිනය කොළඹ පිහිටි එහි ප්‍රධාන කාර්යාලයේදී සමරන ලදී. පවතින කොවිඩ් 19 වසංගතය හේතුවෙන් මහජනතාවගේ ආරක්ෂාව තහවුරු කිරීමට සිදු වූ බැවින් අතුරුදහන් වූ තැනැත්තන් පිළිබඳ කාර්යාලයට විශාල රැස්වීම් පැවත්වීමට නොහැකි විය. සීමාවන් තිබියදීත් අතුරුදහන් වූ තැනැත්තන් පිළිබඳ කාර්යාලය පවුල්වල අයිතීන් සහ විඳවීම් පිළිගැනීම තහවුරු කරනු පිණිස සහ අතුරුදහන් වීම් සම්බන්ධව වැඩි අවධානයක් ලබාගැනීමට මෙම දිනය සැමරුවේ ය.

8.3 එවකට සිටි සභාපති සාලිය පිරිස් මහතා අතුරුදහන් වූවන්ගේ ඔවුන්ගේ පවුල්වල අයිතිවාසිකම් සහ අතුරුදහන් වීම් පැවති බව පිළිගැනීමේ වැදගත්කම පිළිබඳව රැස්වීම ඇමතුවෙය. පිරිස් මහතා අතුරුදහන සැලසීම පිළිබඳව සහ සහන ලබා ගැනීම සඳහා පවුල් මුහුණ දී ඇති දුෂ්කරතා පිළිබඳව ද සාකච්ඡා කළේය. අතුරුදහන් වූ තැනැත්තන් පිළිබඳ කාර්යාලය විසින් සකස් කරන ලද පැමිණිලි හා තොරතුරු ලැයිස්තුවේ වැදගත්කම සහ අතුරුදහන් වූවන්ගේ අයිතිවාසිකම් සහ අවශ්‍යතා ඉදිරියට ගෙන යාම සඳහා රාජ්‍ය හා රාජ්‍ය නොවන ආයතනවලට එය භාවිතා කළ හැක්කේ කෙසේද යන්න පිළිබඳව කොමසාරිස් මිරාක් රහීම් මහතා අදහස් පළ කළේ ය.

අතුරුදහන් වූ කැනැත්තන් පිළිබඳ කාර්යාලය
2020 දෙසැම්බර් **31** වන දිනට මූල්‍ය තත්වය

වත්කම්	සටහන	2020 (රු)	2019 (රු)
ජංගම නොවන වත්කම්			
දේපළ, පිරියත සහ උපකරණ	1	2,81,02,075.67	3,36,68,713.34
ජාත්‍යන්තර දින සැමරුම්			54,97,564.70
ජංගම වත්කම්			
පෙරගෙවූ වියදම්	2	36,108.00	
ලැබිය යුතු	3	3,65,330.40	3,10,000.00
මුළු වත්කම්		**2,85,03,514.07**	**3,94,76,278.04**
බැරකම්			
ජංගම නොවන බැරකම්			
පාරිතෝෂික ප්‍රතිපාදන		7,43,120.00	
ජංගම වගකීම්			
උපචිත වියදම්	4	43,12,609.44	51,99,967.17
ණයකරුවන්	5	27,830.00	37,268.56
ගෙවිය යුතු වැටුප්	6	24,603.13	1,20,603.10
මුළු බැරකම්		**43,65,042.57**	**53,57,838.83**
ශුද්ධ වත්කම්/ස්කන්ධ			
ශුද්ධ වත්කම්	7	2,33,95,351.50	3,41,18,439.21
මුළු ස්කන්ධ සහ බැරකම්		**2,85,03,514.07**	**3,94,76,278.04**

සහතිකකරණය

ඉහත මූල්‍ය ප්‍රකාශ 2020 දෙසැම්බර් 31 දිනට සත්‍ය හා සාධාරණ දැක්මක් ලබා දී ඇති බව අපි සහතික කරමු.

....

ඩී.ඒ. දිසානායක **වී.බී පර්ල් කේ. වීරසිංහ**
අධ්‍යක්ෂ (මූල්‍ය සහ ප්‍රසම්පාදන) විධායක අධ්‍යක්ෂ

මූල්‍ය ප්‍රකාශ සැකසීම සහ ඉදිරිපත් කිරීම සම්බන්ධව අධ්‍යක්ෂ මණ්ඩලය වග කියනු ලැබේ. මෙම මූල්‍ය ප්‍රකාශ අධ්‍යක්ෂ මණ්ඩලය විසින් අනුමත කරන ලද අතර ඔවුන් වෙනුවෙන් අත්සන් තබන ලදී.

....

ගරු විනිසුරු උපාලි අබේරත්න
සභාපති

එම්.ඒ. මල්කිදේවි පීරිස්
අධ්‍යක්ෂ මණ්ඩල සාමාජික
(කොමසාරිස්)

මිරාක් රහීම්
අධ්‍යක්ෂ මණ්ඩල සාමාජික
(කොමසාරිස්)

අනුරුදහන් වූ තැනැත්තන් පිළිබඳ කාර්යාලය

ආදායම සහ වියදම් ප්‍රකාශ

2020 දෙසැම්බර් 31 න් අවසන් වූ වසර සඳහා

	සටහන	**2020** (රු)	**2019** (රු)
ආදායම			
ආදායම - පුනරාවර්තන ප්‍රදාන		81300000.00	64039036.37
මුළු ආදායම		**81300000.00**	**64039036.37**
වියදම			
වැටුප් වේතන හා දීමනා	**8**	39520158.83	25853203.06
ගමන් වියදම්	**9**	2845326.00	43,33,055.88
සැපයුම් සහ භාවික කළ පරිභෝජ්‍ය භාණ්ඩ	**10**	28,43,155.99	76,28,739.02
නඩත්තු වියදම්	**11**	3,57,896.18	13,44,602.98
ක්ෂය කිරීම්		57,63,215.89	6,98,309.68
සේවාවන්	**12**	3,30,23,155.77	3,16,26,346.98
මුළු වියදම්		**8,43,52,908.66**	**7,14,84,257.60**
කාල සීමාව සඳහා අතිරික්තය/ (ඌනතාව)		**(3,052,908.66)**	**(74,45,221.23)**

	භාණ්ඩාගාරය විසින් ප්‍රදානය කළ ප්‍රාග්ධනය	සමුච්චිත අරමුදල්	වසර සඳහා අතිරික්තය/ (ඌනතාව)	එකතුව
	(රු)	(රු)	(රු)	(රු)
2019/01/01 දිනට ආරම්භක ශේෂය	-	53,73,654.59	-	53,73,654.59
භාණ්ඩාගාර ප්‍රාග්ධන ප්‍රදාන	2,48,92,401.27	-	-	2,48,92,401.27
එක්සත් ජාතීන්ගේ සංවර්ධන වැඩසටහන වෙතින් ප්‍රාග්ධන ප්‍රදාන	84,97,942.00	-	-	84,97,942.00
පූර්ව අතිරික්තය/(ඌනතා) ගැලපුම්	-	-	18,14,545.00	18,14,545.00
2019 වසර සඳහා අතිරික්තය/ (ඌනතාව)	-	-	(74,45,221.23)	(74,45,221.23)
පූර්ව වසර ගැලපුම්	-	9,85,117.58	-	9,85,117.58
2019/12/31 වන දිනට ශේෂය	3,33,90,343.27	63,58,772.17	(56,30,676.23)	**3,41,18,439.21**
2020/01/01 දිනට ආරම්භක ශේෂය	-	3,41,18,439.21	-	3,41,18,439.21
පූර්ව වසර ගැලපුම්	-	(83,70,179.05)	-	(83,70,179.05)
භාණ්ඩාගාර ප්‍රාග්ධන ප්‍රදාන	7,00,000.00	-	-	7,00,000.00
2020 වසර සඳහා අතිරික්තය/ (ඌනතාව)	-	-	(3,052,908.66)	(3,052,908.66)
2020/12/31 වන දිනට ශේෂය	7,00,000.00	2,57,48,260.16	(3,052,908.66)	**2,33,95,351.50**

	සටහන	2020 (රු)	2019 (රු)
මෙහෙයුම් ක්‍රියාකාරකම්			
මුදල් ලැබීම්			
අරමුදල් - පුනරාවර්තන			
ජලය සහ විදුලි බලය සඳහා ජනාධිපති/අමාත්‍ය කාර්යාලය වෙතින් ලැබීම්		81300000.00	63935713.87
ආරක්ෂක සේවාවන් සඳහා හානිපූර්ණ කාර්යාලය වෙතින් ලැබීම්		651007.40	2036492.81
වෙනත් ලැබීම්		308207.36	-
		307874.00	39685.31
මුදල් ගෙවීම්			
වැටුප් හා වෙකන		(2,89,92,795.78)	(1,51,24,076.91)
නිවාඩු දින ගෙවීම් සහ අතිකාල		(1,75,908.91)	(4,81,50 3)
වෙනත් දීමනා		(1,20,40,802.63)	(1,02,39,701.45)
ගමන් සහ උපවේශන - දේශීය		(25,35,296.00)	(30,86,592.41)
ගමන් සහ උපවේශන - විදේශ		-	(13,21,145.91)
ලිපිද්‍රව්‍ය කාර්යාල අවශ්‍යතා		(17,79,703.70)	(24,81,226.98)
ඉන්ධන වියදම්		(10,99,535.11)	(13,30,741.92)
